**unit 12**

# ඉන්දියානු ආණ්ඩුක්‍රමය

වාගීෂ්වර

- ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය
- සංඝීය ක්‍රමය
- පක්ෂ ක්‍රමය

sureka wageeshwara

# ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

## ඉ න්දියානු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

01. **ලිඛිත ආණ්ඩුක්‍රමයක් වීම.**

ඉන්දියානු ආණ්ඩුක්‍රමය ලිඛිත ආණ්ඩුක්‍රමයක් වේ. එය 1950 ජනවාරි 26 දින සිට ක්‍රියාත්මක වේ. ලොව ඇති දීර්ඝතම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙය වේ. මෙහි වගන්ති 395 (වර්තමානයේ 448) පරිච්ඡේද 22 ක් (වර්තමානයේ 25) උපලේඛණ 12 ක් ඇමුණුම් 3 කින් යුක්ත ලියවිල්ලකි.

02. **කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් වීම.**

ඉන්දීය ආණ්ඩුක්‍රමය කැබිනට් ආණ්ඩුක්‍රමයක් වේ. එය බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය පූර්වාදර්ශය කොටගත් ආණ්ඩුක්‍රමයකි. කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි නිර්වචනය කරන්නේ නම්, ව්‍යවස්ථාදායක පාර්ලමේන්තුව තුලින් තෝරාගත් කැබිනට් මණ්ඩලයක් විධායක කටයුතු කරන ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය. ඉන්දියාව එවැනි ආණ්ඩුක්‍රමයකි. තවදුරටත් කැබිනට් ආණ්ඩුක්‍රමයක පවතින ලක්ෂණ එහි පවතී. ද්විත්ව විධායකයක් පැවතිම, රාජ්‍යය නායකයා විසින් ආණ්ඩුවේ නායකයා පත් කිරීම, අගමැතිට විශාල බලයක් හිමිවීම. විරුද්ධ පක්ෂයක වැදගත් භූමිකාවක් හිමි වීම.

03. **අනම්‍ය ආණ්ඩුක්‍රමයක් වීම.**

ඉන්දීය ආණ්ඩුක්‍රමය අනම්‍ය ආණ්ඩුක්‍රමයකි. අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු ව්‍යවස්ථාදායකයේ ½ ක සරල බහුතරයකින් සංශෝධනය කළ නොහැකි ව්‍යවස්ථා ය. ඉන්දියාව අනම්‍ය ආණ්ඩුක්‍රමයකි. **එය සංශෝධනය සඳහා යොදා ගන්නා විධිවිධාන කිහිපයකි.**

**I ක්‍රමය** -: ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පාර්ලිමේන්තුවේ ½ ක සරල බහුතරයකින් සංශෝධනය කළ හැකි වගන්ති පවතී. නිදසුන් ලෙස නව ප්‍රාන්ථ පිහිටුවීම, ප්‍රාන්ථයන්හි දේශසීමා සංශෝධනය කිරීම හා බැඳි නීති මීට අදාළ වේ.

**II ක්‍රමය** -: ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් වගන්ති පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකම (2/3) විශේෂ බහුතරයකින් සංශෝධනය කළ යුතු ය. නිදසුන් ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති, මූලික අයිතිවාසිකම් හා සම්බන්ධ නීති මීට අදාළ වේ.

**III ක්‍රමය** -: ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් වගන්ති පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකේ (2/3) විශේෂ බහුතරයකින් සහ ප්‍රාන්ථ රාජ්‍යවල (2/3) ක විශේෂ බහුතර අනුමැතියෙන් සංශෝධනය කළ යුතුය. නිදසුන් ලෙස ජනාධිපතිවරයා තෝරා ගැනීම, මධ්‍ය ආණ්ඩුවේ විධායක බලතල සම්බන්ධ වගන්ති දැක්විය හැකිය.

මෙවැනි දෘඪ අනම්‍ය ක්‍රියාමාර්ග තුළ වුවද වසර 61 ක් තුළ ඉන්දීය ආණ්ඩුක්‍රමය 94 වතාවක් සංශෝධනයට ලක් වී තිබේ.

04. ඒකීය පුරවැසි භාවය.

ඉන්දියාව සංධීය රාජ්‍යයක් වුවද එහි පවතින්නේ ඒකීය පුරවැසි භාවයකි. එනම්, සියලු පුරවැසියන්ට මධ්‍යම ආණ්ඩුවේ පුරවැසි භාවය උරුම වී තිබේ. නමුත් සම්භාව්‍ය සංධීය ක්‍රම තුළ ද්විත්ව පුරවැසි භාවයක් ක්‍රියාත්මක වේ. එනම්, සම්භාව්‍ය සංධීය ක්‍රමයක පුරවැසියන්ට මධ්‍ය ආණ්ඩුවේ පුරවැසි භාවය මෙන්ම තමන් ජීවත්වන ප්‍රාන්ත රාජ්‍යයේ පුරවැසි භාවය ද හිමි වේ. නමුත් ඉන්දියාව තුළ පවතින්නේ ඒකීය පුරවැසිභාවයකි. එම නිසා ඉන්දියාව සම්භාව්‍යය සංධීය ක්‍රමයක් ලෙස අර්ථකථනය කළ නොහැකිය.

05. සංධීය ආණ්ඩුක්‍රමයක් වීම.

ඉන්දියාව තුළ සංධීය ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක වේ. මේ අනුව සංධීය ආණ්ඩුක්‍රමයක තිබිය යුතු සියලු ගුණාංග ඉන්දීය ආණ්ඩුක්‍රමයක තුළ අඩංගු වේ. නමුත් ප්‍රායෝගික භාවිතය තුළ ඉන්දීය ආණ්ඩුක්‍රමය තුළ සංධීය ලක්ෂණ යටපත් වී මධ්‍ය ආණ්ඩුව බලවත් වූ අර්ධ සංධීය ස්වරූපයක් හඳුනාගත හැකිය. එම නිසා ඉන්දීය ආණ්ඩුක්‍රමය සම්භාව්‍යය සංධීය ලක්ෂණ වලින් බිඳුණු ඉන්දියාවටම ආවේණික වූ සංධිය ලක්ෂණ වලින් යුක්ත ආණ්ඩුක්‍රමයක් බවට පත් වී තිබේ.

06. ඒකීය අධිකරණ ක්‍රමය.

ඉන්දියාව තුළ ක්‍රියාත්මක වන්නේ ඒකීය ආණ්ඩුක්‍රමයකි. ඉන්දියාව තුළ ක්‍රියාත්මක වන්නේ මධ්‍ය ආණ්ඩුවේ අධිකරණ ක්‍රමයයි. එහි උසස්ම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. සම්භාව්‍යය සංධීය ක්‍රමයන් තුළ ද්විත්ව අධිකරණ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. එනම්, මධ්‍ය ආණ්ඩුවේ අධිකරණ ක්‍රමය සහ ප්‍රාන්තීය අධිකරණ ක්‍රමය යි. නමුත් ඉන්දියාව තුළ පවතින්නේ ඒකීය අධිකරණ ක්‍රමයකි.

07. අනාගමික ආණ්ඩුක්‍රමයක් වීම.

ඉන්දියානු ආණ්ඩුක්‍රමය තුළ ස්වකීය රාජ්‍යය අනාගමික රාජ්‍යයක් බව පිළිගනී. නමුත් ඉන්දියානු ආණ්ඩුක්‍රමය තුළ 'අනාගමික' යන වාක් සංකේතය භාවිතා කර නොමැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රාජ්‍යය ආගමක් ප්‍රකාශයට පත්කර නොමැත. සෑම පුරවැසියකුටම තමන් කැමති ආගමක් ඇදහීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර තිබෙයි.

08. මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කර තිබේ. එය තුළ මූලික අයිතිවාසිකම් ආකාර (හය) 6 කට වර්ග කරණු ලැබේ.

නිදර්ශන : සාමානාත්මතාවය සඳහා ඇති අයිතිය.
නිදහස සඳහා ඇති අයිතිය.
සූරාකෑමට ලක් නොවීමේ අයිතිය.
ආගමික නිදහස.
සංස්කෘතික සහ අධ්‍යාපනික අයිතිවාසිකම්.
ව්‍යවස්ථාමය ප්‍රතිපාදන.

09. ද්විමාණ්ඩලික ව්‍යවස්ථාධායකය.

# ව්‍යවස්ථාදායකය

## ව්‍යවස්ථාධායක (පාර්ලිමේන්තුව)

පොදු හැඳින්වීම

ඉන්දියානු <u>ව්‍යවස්ථාදායක ආයතනය පාර්ලිමේන්තුවයි</u>. <u>ඉන්දියානු ව්‍යවස්ථාදායකයේ බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තු ක්‍රමයේ ලක්‍ෂණ මෙන්ම ඇමරිකානු සංධීය ක්‍රමයේ ලක්‍ෂණ පවතී</u>.ඉන්දීය ව්‍යවස්ථාදායකය බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුව මෙන් විධායකය කෙරෙහි බලපෑම් කරනු ලබන ආයතනයක් වේ. ඉන්දියානු ව්‍යවස්ථාදායකයේ සංයුතිය බොහෝ දුරට සකස් වී තිබෙන්නේ අමෙරිකානු සංධීය ක්‍රමයේ ව්‍යවස්ථාදායකය පදනම් කරගෙනය. <u>ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වගන්තියට අනුව ඉන්දියානු සංධීය රාජ්‍යයේ ව්‍යවස්ථාදායකය **ද්වි මාණ්ඩලික වේ.**</u>

i **ලොක් සභාව**

ii **රාජ්‍ය සභාව**

හැඳින්වීම

### ■ <u>ලොක් සභාව.</u>

මොකක්ද:

ඉන්දියානු ආණ්ඩුක්‍රමයට අනුව පිහිටුවා ඇති ව්‍යවස්ථාදායක <u>පාර්ලිමේන්තුවේ පළමු සභාව ලොක් සභාවයි</u>. මෙය **මහජන මන්ත්‍රී මණ්ඩලය** ලෙස ද හඳුන්වයි.

සංයුතිය :

ලොක් සභාවේ <u>සාමාජිකයන් 545 කි</u>. **ප්‍රධාන ක්‍රම** දෙකකට තෝරා පත් කරයි.

පත්කිරීම් : සාමාජිකයන්

**I ක්‍රමය** -: 543 මහජනතාව විසින් මැතිවරණයක දී තෝරා ගනී. ප්‍රාදේශීය පදනමක් මත බෙදා වෙන් කරන ලද ඡන්ද කොට්ඨාශ තුලින් <u>සරල බහුතර නියෝජන ක්‍රමය</u> හරහා එම තෝරා ගැනීම සිදු කරයි. <u>වාර්ගිකව තෝරාගන්නා සාමාජිකයන් කිහිප දෙනෙක් ද ඇත</u>.

**II ක්‍රමය** -: දෙදෙනෙක් <u>ජනාධිපතිවරයා විසින් තෝරාපත් කරයි</u>. ඒ **ඉංග්‍රීසි සම්භවයක් සහිත** ආංගල **ඉන්දියානුවන්ට නියෝජනයක් ලබා දීම සඳහාය.**

545

543
මැතිවරණයක දී ජනතාව
විසින් තෝරා ගනී.

(ප්‍රාදේශීය සහ වාර්ගික පදනමක් මත)

2
නාමික විධායකය ජනාධිපති
විසින් තෝරාපත් කරයි.

(ආංගල ඉන්දියානුවන්ට
නියෝජනයක් ලබා දීම සඳහා)

සුදුසුකම් : ලොක් සභාවේ සාමාජිකයෙකු ලෙස තේරී පත්වීමට අවශ්‍ය සුදුසුකම්, ඉන්දියානු පුරවැසියෙකු වීම - වයස අවුරුදු 25 සම්පූර්ණ වීම - පාර්ලිමේන්තු පනත් මගින් දක්වා ඇති අනිකුත් සුදුසුකම් සපුරා ලීම අවශ්‍ය වේ.

නිලකාලය: <u>ලොක් සභාවේ නිලකාලය වසර 5 කි</u>. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 352 වගන්තියට අනුව රාජ්‍යය හදිසි අවස්ථාවක දී ලොක් සභාවේ නිලකාලය <u>එක් වසරකින් දීර්ඝ කළ හැකිය</u>.

වෙනත් : <u>ලොක් සභාවේ සභාපතිවරයා කථානායකවරයායි</u>. කථානායකවරයා මහමැතිවරණයකට පසුව ලැබෙන පළමු ලොක් සභා සැසිවාරයක දී මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තෝරා ගනී.

● <u>කාර්යය හා බලතල</u>

(i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල</u>.

ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නිති සම්පාදනය කිරීමට බලතල ඇත. මුදල් පනත් හා සාමාන්‍ය පනත් ආරම්භ කිරීමට බලතල ඇත. <u>මුදල් පනතක් නම් ආරම්භ කිරීමට හැකි එකම සභාව මෙය වේ</u>.

(ii) <u>විධායක අංශයේ කාර්ය හා බලතල</u>.

විධායකය පාලනය කිරීම හා මෙහෙයවීම,

ඉන්දියානු දේශපාලන විධායක කැබිනට් මණ්ඩලයයි. කැබිනට් මණ්ඩලය තෝරාගනු ලබන්නේ ව්‍යවස්ථාදායකයේ විශේෂයෙන් ලොක් සභාව තුළිනි. එම නිසා <u>පාලන කටයුතු සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට විශේෂයෙන් ලොක් සභාවට වගකිව යුතු ය</u>. එසේ වග නොකියන විට ලොක් සභාව තුළ සම්මත කරනු ලබන <u>විශ්වාස භංග යෝජනවාක් මගින් කැබිනට් මණ්ඩලය ඉවත් කිරීමට ලොක් සභාවට හැකිය.</u> එම නිසා ඍජුව විධායකය පාලනයට ලොක් සභාවට හැකිය.

තවදුරටත්,

<u>ප්‍රශ්න විචාරීම - විනිශ්චය කිරීම - චෝදනා කිරීම - තර්ජනය කිරීම</u> - ආයාචනා කිරීම - මහජන මතය ඉදිරිපත් කිරීම - දුකගැනවිලි ඉදිරිපත් කිරීම වැනි වක්‍රාකාර ක්‍රියා මාර්ග මගින් ද විධායකය පාලනයට හා මෙහෙයවීමට ලෝක් සභාවට හැකිය.

(iii) <u>මූල්‍යමය බලතල.</u>

පාලන කටයුතු සඳහා ආණ්ඩුවට අවශ්‍ය මුදල් ලබා ගැනීමට සිදුවන්නේ ව්‍යවස්ථාදායකය තුළිනි. එම මුදල් වියදම් කිරීම කළ යුත්තේ ද ව්‍යවස්ථාදායකයේ අනුමැතිය මතය. මුදල් පනත් ආරම්භ කිරීමට බලය ඇත්තේ ලොක් සභාවට පමණි. අයවැය ලේඛනය අනුමත කිරීම වැනි විශාල මූල්‍යමය බලතල ප්‍රමාණයක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය බුක්ති විඳී.

(iv) **මහජනතාවගේ දුක් ගැනවිලි, අවශ්‍යතාවයන් සොයා බැලීම.**

(v) **මන්ත්‍රීවරුන් පුහුණු කිරීම (අනාගත නායකයන් පුහුණු කිරීම)**

(vi) **විධායකයට අවශ්‍යය බහුතරය සැපයීම.**

(vii) **මහජන මතය ඉදිරිපත් කිරීම.**

හැඳින්වීම ■ **රාජ්‍ය සභාව.**

මොකක්ද: ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පිහිටුවා ඇති ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ දෙවන සභාව රාජ්‍ය සභාවයි. මෙම සභාව, **රාජ්‍ය කවුන්සිලය - ප්‍රාන්ථ මණ්ඩල - ඉහළ මණ්ඩලය - මහල්ලන්ගේ මණ්ඩලය** යන නාමකරණයන්ගෙන් ද හඳුන්වයි.

සංයුතිය :
පත්කිරීම :
සාමාජිකයන්

රාජ්‍ය සභාවේ සාමාජිකයන් 250 කි . **එම සාමාජිකයන් ආකාර දෙකකට තෝරා ගනී.**

**I ක්‍රමය -:** 238 ප්‍රාන්ත වල ජනතා ඡන්දයෙන් තෝරා ගනී. ඒ ඒ ප්‍රාන්ත වලට හිමි නියෝජිතයින් ප්‍රමාණය තීරණය වන්නේ ඒ ඒ ප්‍රාන්තයේ ඇති ජන අනුපාතයේ ප්‍රමාණය මතය. සමානුපාතික නියෝජන ක්‍රමයේ පැවරිය හැකි ඡන්ද ක්‍රමය මේ සඳහා භාවිතා කරන නියෝජන ක්‍රමය වේ.

**නිදර්ශන :**

| | | |
|---|---|---|
| තමිල්නාඩු | - | 18 |
| ගුජරාටි | - | 11 |
| දිල්ලි | - | 03 |
| නාග ලන්තය | - | 01 |
| කේරල | - | 09 |

**II ක්‍රමය -:** 12 ක් නාමික විධායකය වන ජනාධිපති වරයා විසින් තෝරාපත් කරයි. මෙසේ පත් කිරීමේ අරමුණ වන්නේ සාහිත්‍යය, කලා, විද්‍යා සහ සමාජ සේවය යන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ සේවයක් කළ උගතුන් බුද්ධිමතුන් ව්‍යවස්ථාදායකයට සම්බන්ධ කර ගැනීමයි.

**250**

**238** (ප්‍රාන්තවල ජනතාව විසින් තෝරා ගනී)

**12** (ජනාධිපතිවරයා විසින් තෝරාපත්රයි)

බ්‍රිතාන්‍යය සාමි මන්ත්‍රී මණ්ඩලය හැරුණු විට ලොව ඇති විශාලම සාමාජිකයන් ප්‍රමාණයක් සහිත දෙවන මණ්ඩලය වන්නේ රාජ්‍ය සභාවයි.

සුදුසුකම්: <u>රාජ්‍ය සභාවේ සාමාජිකයෙකු ලෙස තෝරාපත් වීමට අවශ්‍ය සුදුසුකම්,</u> **ඉන්දියානු පුරවැසියකු වීම, වයස අවුරුදු 30 සම්පූර්ණ වීම, පාර්ලිමේන්තු නීති මගින් දක්වා ඇති අනිකුත් සුදුසුකම්** සපුරාලීම අවශ්‍යය වේ.

නිලකාලය <u>රාජ්‍ය සභාව එකවර විසිර නොයන</u> අඛණ්ඩව ක්‍රියාත්මක වන ස්ථාවර සභවකි. වසර දෙකකට වරක් සභාවෙන් 1/3 ක් ඉවත් වන අතර ඒ සඳහා අලුතින් 1/3 ක් තෝරා ගනී. **එක් සාමාජිකයෙක් වසර හයක් මෙහි රැඳී සිටියි.**

## ■ <u>කාර්යය හා බලතල</u>

### (i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්යය හා බලතල</u>.

ව්‍යවස්ථාදායක සභාවක් ලෙස නීති සම්පාදනය කිරීමට බලතල ඇත. එය කොටස් දෙකක් යටතේ අධ්‍යයනය කළ යුතු ය.

- මුදල් පනත් කෙටුම්පත්
- මුදල් නොවන පනත් කෙටුම්පත් (සාමන්‍යය පනත් කෙටුම්පත්)

**මුදල් පනත් කෙටුම්පත්** <u>**ආරම්භකිරීමට බලතල රාජ්‍යය සභාවට නැත**</u>. ලොක් සභාව විසින් සම්මත කොට රාජ්‍යය සභාවේ අනුමැතිය සඳහා එවන ලද මුදල් පනතක් **සම්මත කිරීමට දින (14) ක් රඳවා තබා ගැනීමට (කල්දැමීමට) හැකිය. ප්‍රතික්ෂේප කළ නොහැකිය. සංශෝධනය කළ නොහැකිය.** ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම පමණක් සිදු කළ හැකිය. එම නිර්දේශ පිළිගන්නවා ද නැද්ද යන්න තීරණය කරනු ලබන්නේ ලොක් සභාව විසිනි. මුදල් පනත් සම්බන්ධයෙන් අවම බලතල රාජ්‍ය සභාව සතු කර තිබේ.

**සාමාන්‍යය පනත් කෙටුම්පත්** <u>**සම්බන්ධයෙන් ලොක් සභාවට සමාන බලතල රාජ්‍ය සභාව සතුය**</u>. සාමාන්‍යය පනත් කෙටුම්පත් ආරම්භ කළ හැකිය. ලොක් සභාව විසින් සම්මත කොට රාජ්‍ය සභාවේ අනුමැතිය සඳහා එවන ලද සාමාන්‍ය පනත් කෙටුම්පතක් **සම්මත කිරීමට - සංශෝධනය කිරීමට - මාස හයක් (6) රඳවා තබා ගැනීමට (කල් දැමීමට) හැකිය. ප්‍රතික්ෂේප කළ නොහැකිය.**

**(N.B)** <u>*පනත් කෙටුම්පතක් නීතියක් වීම සඳහා මණ්ඩල දෙකේම අනුමැතිය අවශ්‍ය වේ. යම් කෙටුම්පතක් සම්බන්ධයෙන් මණ්ඩල දෙකේම ඒකාග්‍රතාවයක් නොවුන හොත් මණ්ඩල දෙකේම ඒකාබද්ධ සැසිවාරයක දී බහුතර ඡන්දයෙන් ඒම පනත සම්මත කළ යුතු ය.*</u>

නිදර්ශන : **1961 දැවැදි තහනම් කිරීමේ පනත ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙකේ ඒකාබද්ධ සැසිවාරයක දී බහුතර ඡන්දයෙන් සම්මත කිරීම.**

(ii) <u>විධායක අංශයේ කාර්ය හා බලතල.</u>

විධායකය වන කැබිනට් මණ්ඩලයට සාමාජිකයන් තෝරාගැනීමේ දී රාජ්‍ය සභාවෙන් ද සාමාජිකයන් ප්‍රමාණයක් තෝරා ගනී. ඒ හරහා විධායක අංශයේ බලතල රාජ්‍ය සභාවට හිමි වේ.

<u>විධායකය සෘජුව පාලනයට හා මෙහෙය වීමට රාජ්‍ය සභාවට බලතල නොමැත</u>. නමුත් කැබිනට් මණ්ඩලයෙන් **ප්‍රශ්න විචාරීම - විවේචනය කිරීම - විවාද පැවැත්වීම චෝදනාකිරීම** වැනි වක්‍ර ක්‍රම හරහා විධායකය වන කැබිනට් මණ්ඩලය උපහාසයට අපහසුතාවයට පත්කරමින් කිසියම් ප්‍රමාණායකට විධායකය පාලනයට හා මෙහෙය වීමට රාජ්‍ය සභාවට හැකිය.

**(iii) රාජ්‍යය ගිණුම්කාරක සභාවේ සාමාජිකත්වය හිමි වීම.**

**(iv) රාජ්‍යය ව්‍යවසාය සභාවේ සාමාජිකත්වය හිමි වීම.**

<u>ලොක් සභාවට අහිමි රාජ්‍ය සභාවට පමණක් හිමි බලතල දෙකක් (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ.</u>

312 වගන්තිය

I **සමස්ත ඉන්දියාවටම හෝ ප්‍රාන්ත රාජ්‍යයකට හෝ ඒ දෙකටම අදාළ වන පරිදි සමස්ත ඉන්දීය සේවාවන් පිහිටුවීමට පාර්ලිමේන්තුවට බලය පැවරීමට රාජ්‍යය සභාවට බලය ඇත.**

244 වගන්තිය

II **රාජ්‍යය සභාව විසින් 2/3 ක බහුතර ඡන්දයෙන් සම්මත කරන යෝජනාවක් මගින් ප්‍රාන්ත බලතල ලැයිස්තුවේ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් නීති පැනවීමේ බලය එක් වසරක කාලයක් සඳහා පාර්ලිමේන්තුවට පැවරිය හැකිය.**

<u>ලොක් සභාව හා රාජ්‍ය සභාව හවුලේ භුක්ති විඳින බලතල</u>.

I **ජනාධිපතිවරයා පත් කිරීම හා ජනාධිපතිවරයාට එරෙහි දෝෂාභියෝග චෝදනාව ගෙන ඒම.**

II **උප ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් - ඉන්දියාවේ විගණනකාධිපතිවරයා තනතුරින් ඉවත් කිරීම.**

III **හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම අනුමත කිරීම.**

IV **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.**

▫ <u>නාමික විධායකය ද ඇතුලත් ය.</u>

<u>ඉන්දියාවේ ව්‍යවස්ථාදායකයට නාමික විධායක ජනාධිපතිවරයා ද අයත් වේ</u>. පාර්ලිමේන්තු වේ මණ්ඩල දෙක සම්මත කරන පනත් කෙටුම් පත් 'නීති' බවට පත් වීමට ජනාධිපති වරයාගේ අවසාන අනුමැතිය අවශ්‍ය වේ.

## <u>ඉන්දියානු පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යය (පරමාධිපත්‍යය)</u>

- **<u>පාර්ලිමේන්තු පරමාධිපත්‍යය (ස්වාධිපත්‍ය) අර්ථ නිරූපණය</u>**

  **"ස්වාධිපති පාර්ලිමේන්තුවක් යනුවෙන් අදහස් කරනු ලබන්නේ වෙනත් ආයතනවල බලපෑමකින් හෝ සීමාවකින් තොරව නීති සම්පාදනයට හැකියාව ඇති පාර්ලිමේන්තුවක් ය"**

  **"ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ අභිමතයට අනුව ඕනෑම නීතියක් සම්පාදනයට - සංශෝධනයට - නිශේධනය කිරීමට පාර්ලිමේන්තුව සතු පරම සහ අසීමිත අධිකාරී බලය පාර්ලිමේන්තු පරමාධිපත්‍යය යන්නෙන් සංකේත වේ."**

- **<u>ස්වාධිපති නොමැති පාර්ලිමේන්තුවක හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි</u>.**

  - නීති සම්පදානය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සමාන හෝ උසස් ආයතන පැවතීම.
  - ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය සීමාකරන වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දැක්වීම.
  - ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලයට බලපෑම් කිරීමට හැකි වීම.

▪ **<u>ඉන්දියානු පාර්ලිමේන්තුව ස්වාධිපති පාර්ලිමේන්තුවක් නොවේ. එය පහත සඳහන් නිදර්ශන මගින් සනාථ කළ හැකිය.</u>**

(i) **නීති සම්පාදන බලයට බලපෑම් පැවතීම. (අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය)**

**<u>ඉන්දියානු ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය ක්‍රියාත්මක වේ</u>. අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය යන්නෙන් සංකේතවත් වන්නේ** ව්‍යවස්ථාදායකය **සකස් කරන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ද නැද්ද පරීක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලයයි.** මෙම බලය යටතේ පාර්ලිමේන්තුව සකස් කරන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ නම් එම නීති නිශේධ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකිය. <u>එම නිසා ඉන්දියානු පාර්ලිමේන්තුව ස්වාධිපති (පරමාධිපත්‍යය) ව්‍යවස්ථාදායක් ලෙස හඳුනාගත නොහැකිය</u>.

(ii) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයට පූර්ණ බලතල ව්‍යවස්ථාදායකයට හිමි නොවීම.**

# විධායකය

## නා මික විධායකය (ජනාධිපතිවරයා)

හැඳින්වීම.

කවුද: ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පිහිටුවා ඇති නාමික විධායකය **ජනාධිපතිවරයාය. ජනාධිපතිවරයා, රාජ්‍ය නායකයා, විධායකයේ නායකයා - සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා** වේ.

පත්කිරීම නාමික විධායකය ජනාධිපතිවරයා තෝරා ගනු ලබන්නේ **ඡන්ද විද්‍යාලයක් (වරණ මණ්ඩලයක්)** මගිනි. එම ඡන්ද විද්‍යාලය සකස් වන්නේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙකේ ජනතා ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවවරුන්ගෙන් සහ ප්‍රාන්ත රාජ්‍ය වල ව්‍යවස්ථාදායකයන්හි ජනතා ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන්ගෙන් ය. ඡන්ද විද්‍යාලයට ජනතා ඡන්ද යෙන් ව්‍යවස්ථාදායකයටන්ට තේරී පත් වූ මන්ත්‍රීවරුන් හැර නාමකරණ යෙන් පත් වූ මන්ත්‍රී වරුන් ඇතුලත් වන්නේ නැත. මේ අනුව ඉන්දියානු නාමික විධායක ජනාධිපති වක්‍ර ජනතා ඡන්දයෙන් තෝරා ගනී.

ජනාධිපති තනතුරට ඉදිරිපත් වන අපේක්ෂකයකුගේ නාමයෝජනා පත්‍රය ජනාධිපති තේරීමට ඡන්දය දීම සඳහා සුදුසු ඡන්ද විෘාලයට ඇතුලත් වීමට සුදුසුකම් ලැබූ පනස් දෙනෙකු විසින් යෝජනා කළ යුතු අතර තවත් පනස් දෙනෙකු (50) විසින් අනුමත කළ යුතු ය. ජනාධිපති අපේක්ෂකයකු තැන්පත් කළ යුතු ඇප මුදල රු. 15,000 කි. ප්‍රකාශිත මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 1/6 ක් ලබාගැනීමට නොහැකි වුවහොත් එම මුදල රාජසන්තක වේ. මෙම ගණිතමය දත්ත කාලානුරූපීව සංශෝධනය කරයි. ඡන්දය පවත්වනු ලබන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමයේ තනි මාරු ඡන්ද ක්‍රමය පදනම් කරගෙනය. **ලෝකයේ වෙනත් කිසිදු රාජ්‍යක නාමික විධායකය තෝරාගැනීම සඳහා මෙසේ මැතිවරණ ක්‍රියාවලියක් භාවිතා නොකරයි.**

සුදුසුකම් : ජනාධිපති ධූරය සඳහා යම් පුද්ගලයෙකු තරග කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු සුදුසුකම් කිහිපයකි. **ඉන්දියානු පුරවැසියෙක් වීම - වයස අවුරුදු 35 සම්පූර්ණ වීම. - ලොක් සභාවට තේරී පත්වීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම - ප්‍රාන්ත ව්‍යවස්ථාදායක සභාවක මන්ත්‍රීවරයෙකු නොවීම - රාජයේ පත්වීමක නොසිටීම.**

නිලකාලය : ඉන්දියානු ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 5 කි. එක් පුද්ගලයෙකුට දෙවතාවක් ජනාධිපති ධූරය දැරිය හැකිය.

ඉවත් කිරීම: ඉන්දියානු ජනාධිපතිවරයා නිල කාලය අවසන් වීමට පෙර ඉවත් කළ හැකිය. ඒ දෝශාභියෝගචෝදනාවක් මගිනි. ජනාධිපති ඉවත් කිරීමට අදාළ දෝශාභියෝග චෝදනාව ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙකෙන් ඕනෑම සභාවකට ගෙන ඒමට හැකිය. එය සභා දෙක්ම 2/3 ක විශේෂ බහුතර අනුමැතියකින් සම්මත කළ යුතු ය.

**ජනාධිපතිවරයාට එරෙහිව දෝශාභියෝගයක් ගෙන ඒමට හැකි අවස්ථා.**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම.
- මානසික දුර්වලතාවයකින් පෙලීම.
- අල්ලස් හෝ වෙනත් දූෂණ.
- රාජ්‍ය ද්‍රෝහියෙකු වීම.

ජනාධිපතිවරු **ඉන්දියාව තුළ ජනාධිපතිධූර හෙබ වූ ජනාධිපතිවරු කිහිපදෙනෙකුට අදාළ නිදසුන් , ආචාර්ය රාජේන්ද්‍ර ප්‍රසාත් , ආචාර්ය සකිර් හුසේන්, සාහිල් සිං,ආචාර්ය අබ්දුල් කලාම්, ප්‍රතිභා පටෙල්**

## ■ ජනාධිපතිවරයාගේ කාර්ය හා බලතල

ඉන්දියානු ආණ්ඩුක්‍රමයට අනුව ජනාධිපතිවරයාගේ නාමයෙන් සියලු කාර්යයව් ක්‍රියාවට නැගුව ද ප්‍රායෝගික තත්ත්වය තුළ ඔහු නාමික විධායකයක් බවට පත් වේ. එම නිසා ජනාධිපති සියලු බලතල ක්‍රියාවට නැංවිය යුත්තේ අගමැතිවරයාගේ උපදෙස් මතය. ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාධායක, විධායක, අධිකරණ බලතල භුක්ති විදී.

### ● ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)

(i) **සෑම පනත් කෙටුම්පතකටම අවසාන අනුමැතිය දීම.**

ව්‍යවස්ථාදායකය සකස් කරන සෑම පනත් කෙටුම් පතක්ම නිති බවට පත් වන්නේ ජනාධිපතිවරයාගේ අවසාන අනුමැතිය සමගිනි. එම පනත් සම්මත කිරීමට මෙන්ම **ප්‍රමාදකිරීමට, අවංලගු කිරීමට** ජනාධිපතිවරයාට හැකිය. එය ඔහු සතු ව්‍යවස්ථාදායක අංශයේ බතල වේ.

(ii) **පාර්ලිමේන්තුව කැඳවීම, කල්දැමීම හා විසුරුවා හැරීම.**

(iii) **ලොක් සභාවට මන්ත්‍රීවරු දෙදෙනෙක් (2) පත් කිරීම.**

ඉංග්‍රීසි සම්භවයක් සහිත ආංගල ඉන්දියානුවන්ට නියෝජනයක් ලැබෙන ලෙස මෙම පත්කිරීම් ජනාධිපතිවරයා විසින් සිදු කරයි.

(iv) **රාජ්‍ය සභාවට මන්ත්‍රීවරු දොළොහක් (12) පත් කිරීම.**

(v) **විශේෂ අවස්ථාවල පාර්ලිමේන්තු මූලාසනය ගැනීම.**

(vi) **පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවල නීති හා රෙගුලාසි පැනවීම.**

● <u>විධායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව).</u>

(i) **අගමැති පත් කිරීම.**

ව්‍යවස්ථාදායකයේ ලොක් සභාවේ වැඩිදෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා ජනාධිපති විසින් අගමැති ධූරයට පත් කරයි.

(ii) **අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.**

අගමැතිවරයාගේ උපදෙස් අනුව සමස්ත පාර්ලිමේන්තුව තුලින් අමාත්‍යය මණ්ඩලය තෝරාපත් කරයි.

(iii) **ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවීම.**

අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කරයි. ජනාධිපති රාජ්‍යය නායකයා එය ව්‍යවස්ථාදායකය ඉදිරියේ කියවයි.

(iv) **යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම.**

(v) **තානාපතිවරු පත් කිරීම.**

(vi) **මුදල් කොමිසම, මැතිවරණ කොමිසම, රාජ්‍යය භාෂා කොමිසම යන කොමිෂන් සභා වල සාමාජිකයන් පත් කිරීම.**

(vii) **ත්‍රිවිධ හමුදාපතිවරු පත් කිරීම.**

(viii) **ප්‍රාන්ත ආණ්ඩුකාරවරු පත් කිරීම.**

(ix) **රජයේ උසස් නිලධාරීන් පත් කිරීම.**

(x) **රාජ්‍ය මුද්‍රාව ලග තබා ගැනීම.**

(xi) **විදේශසේවා නිලධාරීන් පත් කිරීම.**

● <u>අධිකරණ අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

(i) **උසස් අධිකරණ ආයතනවලට විනිශ්චකාරවරු පත් කිරීම.**

(ii) **වරදකරුවන්ට සමාව දීම**

(iii) **දඬුවම් අත්හිටුවීම.**

(iv) **අගවිනිසුරුවරයා පත් කිරීම.**

මෙම අකාරයට නාමික විධායකය ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ අංශ සම්බන්ධ විශාල කාර්ය හා බලතල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරයි. නමුත් මෙම බලතල අගමැතිගේ උපදෙස් මත ක්‍රියාවට නැංවිය යුතු ය. <u>තවදුරටත් ජනාධිපතිවරයා සතුවන කාර්ය හා බලතල</u>,

● <u>මූල්‍ය බලතල.</u>

**(i) ලොක් සභාව විසින් ඉදිරිපත් කරන මුදල් පනත් කෙටුම්පත් අනුමත කිරීම.**
**(ii) ප්‍රාන්ථ රාජ්‍යය විසින් පැනවිය යුතු බදු ආදායම් තීරණය කිරීම.**
**(iii) මුදල් කොමිසමේ සාමාජිකයන් පත් කිරීම.**

● <u>විදේශ කටයුතු සම්බන්ධ බලතල.</u>

**(i) විදේශීය රාජ්‍යයන් සමග ගිවිසුම් අත්සන් කිරීම.**
**(ii) අන්තර්ජාතික සහයෝගීතාවය වර්ධනය කර ගැනීම.**
**(iii) විදේශීය සංචාරවල නිරත වීම.**
**(iv) තානාපති නිලධාරීන් පත්කිරීම, පත්කර එවන අය පිළිගැනීම.**

● <u>වෙනත් බලතල.</u>

**(i) හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම ජනාධිපතිවරයා සතු කාර්යය හා බලතල එය ආකාර තුනකි.

- රාජ්‍යය හදිසි අවස්ථාව (වග. 352)
- මුදල් හදිසි අවස්ථාව (වග. 356)
- ප්‍රාන්ත හදිසි අවස්ථාව (වග. 360)

<u>මෙම ආකාරයට ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විශාල කාර්ය හා බලතල ප්‍රමාණයක් හිමි කර දී තිබේ. නමුත් මෙම සියලු බලතල ක්‍රියාමක කළ යුතු වන්නේ දේශපාලන විධායකයේ නායකයා වන අගමැතිගේ උපදෙස් මතය.</u>

● <u>ජනාධිපතිවරයාගේ තත්ත්වය (උපයෝගීතාවය)</u>

ඉන්දියානු ජනාධිපතිවරයා නාමික විධායකය වේ. එම නිසා දේශපාලන විධායකයේ නායකයාගේ උපදෙස් මත බලත ක්‍රියාවට නැගීමට සිදු වේ. <u>නමුත් වෙනත් රටක නාමික විධායකයට සාපේක්ෂව ඉන්දියානු ජනාධිපතිවරයා බලවත් වේ</u>. ඊට බලපෑ හේතු කිහිපයකි.

**1. ඡන්ද විද්‍යාලයක් මගින් තෝරාපත් කිරීම.**

ඡන්ද විද්‍යාලයකින් තෝරා පත් කිරීම යනු වක්‍රාකාර මහජන ඡන්දයෙන් ජනාධිපතිවරයා තේරීමකි.

2. **ඇතැම් විට අගමැතිවරයාගේ උපදෙස් පිළිනොගෙන සිටීමට හැකිවීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා ලෙස කටයුතු කරන්නේ ජනාධිපතිවරයාය. එම නිසා අගමැති විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවැත්මට හානි කර උපදේශයක් දෙන්නේ නම් එය පිළිනාගෙන සිටීමට ජනාධිපතිවරයාට හැකිය. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම සඳහා අභිමතානුසාරී බලතල ක්‍රියාවට නැංවීමට ජනාධිපති වරයාට හැකිය.

3. **පක්ෂ ක්‍රමය.**

බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන නිසා ආණ්ඩු අස්ථාවර වීමේ අවකාශයක් පවතී. එම නිසා දේශපාලන අස්ථාවරභාවය ඇති විය හැකිය. එම නිසා වෙනත් රටකට සාපේක්ෂව නාමික විධායකය බලවත් ය.

4. **සංධීය ක්‍රමය නිසා හිමිවූ විශේෂ බලතල**

## අගමැතිවරයා

හැඳින්වීම.

කවුද: ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, අගමැතිවරයා **ආණ්ඩුවේ නායකයා - දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයේ නායකයා වේ.** මෙම මගින් ස්ථාපනය කරන ලද්දේ බ්‍රිතාන්‍යය අගමැතිධූරයට සමාන අගමැති ධූරයකි.

පත්කිරීම් ආණ්ඩුවේ නායකයා වන <u>අගමැතිවරයා පත් කරනු ලබන්නේ රාජ්‍යය නායකයා ජනාධිපතිවරයා විසිනි</u>. ජනාධිපතිවරයා අගමැතිවරයා ලෙස තෝරාපත් කරන්නේ ව්‍යවස්ථාදායක ලොක් සභාවේ වැඩි දෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයාය. **අගමැතිවරයෙකු පත් කරන ප්‍රධාන අවස්ථා තුනකි.**

- **මහ මැතිවරණයකට පසුව**
- **විශ්වාසභංග යෝජනාවකින් අගමැතිවරයා ඉවත් කළ විට.**
- **අගමැතිවරයා ඉල්ලා අස්වීම හෝ මිය යෑම.**

නිලකාලය : ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැතිවරයාගේ නිලකාලය <u>වසර පහ (5) කි.</u>

ඉවත් කිරීම: ව්‍යවස්ථාදායකයේ ලොක් සභාව තුළ සම්මත කරගනු ලබන විශ්වාසභංග යෝජනාවක් මගින් අගමැතිවරයා ඉවත් කළ හැකිය.

අගමැතිවරු : ඉන්දියාව තුළ <u>අගමැතිධූර හෙබ වූ අගමැතිවරුන් කිහිපදෙනෙකුට නිදර්ශන</u>
**ජවහර්ලාල් නේරු - ලාල් බහදූර් ශාස්ත්‍රී - ඉන්දිරා ගාන්ධි - මන්මෝහන් සිං**

### ■ <u>අගමැතිවරයාගේ කාර්ය හා බලතල.</u>

අගමැතිවරයාට ව්‍යවස්ථාදායක, විධායක අධිකරණ ත්‍රිවිධ අංශ සම්බන්ධ විශාල බලතල ප්‍රමාණයක් හිමි වේ. <u>ජනාධිපති වරයා නාමික විධායකයක් පමණක් නිසා ජනාධිපති වරයාගේ නාමයෙන් සිදුවන බොහෝ කාර්යයන් අගමැතිගේ තීරණ වේ. එම නිසා ඉන්දියාවේ බලවත්ම ධූරය අගමැතිධූරයයි</u>.

● <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව).</u>

(i) **ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තු කැඳවීම, කල්තැබීම, විසුරුවා හැරීම තීරණය කිරීම.**

ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව කැඳවීම, කල්දැමීම හා විසුරුවා හැරීම තීරණය කරනු ලබන්නේ අගමැතිවරයා විසිනි. එය ක්‍රියාත්මක කරනු ලබන්නේ ජනාධිපතිවරයා ය.

(ii) **ලොක් සභාවට මන්ත්‍රීවරු දෙදෙනෙක් (02) පත් කිරීම තීරණය කිරීම.**

(iii) **රාජ්‍ය සභාවට මන්ත්‍රීවරු දොළහක් (12) පත් කිරීම තීරණය කිරීම.**

(iv) **ව්‍යවස්ථාදායකය ලවා තමාට අවශ්‍ය නීති සකස් කරවා ගැනීම.**

අගමැතිවරයා යනු ව්‍යවස්ථාදායකයේ ලොක් සභාවේ වැඩි දෙනාගේ විශ්වාසය දිනාගත් පුද්ගලයාය. එම නිසා අගමැතිවරයාට ලොක් සභාව මගින් තමාට අවශ්‍ය නීති සකස් කරවා ගත හැකිය.

(v) **ව්‍යවස්ථාදායකය පාලනය හා මෙහෙයවීම.**

● <u>විධායක අංශයේ කාර්යය හා බලතල (භූමිකාව).</u>

(i) **කැබිනට් මණ්ඩලයේ නායකයා වීම.**

(ii) **කැබිනට් මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම , විෂයන් තීරණය කිරීම.**

කැබිනට් මණ්ඩලයට තෝරා ගනු ලබන සාමාජිකයන් තීරණය කරනු ලබන්නේ අගමැතිවරයාය. ඔවුන්ගේ කාර්ය ක්ෂේත්‍රය (විෂය) තීරණය කිරීම, අමාත්‍යාංශ ලබා දීම හා මාරුකිරීම, අගමැතිවරයාගේ අභිමතය මත සිදු වේ. කැබිනට් මණ්ඩලය් සාමාජිකයන් ඉවත් කිරීම, කැබිනට් මණ්ඩලය සංශෝධනය කිරීම තීරණය කරනු ලබන්නේ අගමැතිවරයා විසිනි.

(iii) **කැබිනට් මණ්ඩලය තමාට අවශ්‍ය ආකාරයට පාලනය කිරීම.**

අගමැතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියාය. එම නිසා එහි අමාත්‍යවරු නායකයා වන අගමැතිට අවනත විය යුතු ය. එසේ අවනත නොවන අමාත්‍යවරුන් ඉවත් කරන බවට තර්ජනය කරමින් බලහත්කාරයෙන් අවනත කරවා ගත හැකිය. එම නිසා කැබිනට් මණ්ඩලය තමාට අවශ්‍ය ආකාරයට පාලනය හා මෙහෙය වීමට අගමැතිවරයාට හැකිය.

(iv) **හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීම.**

(v) **යුද්ධය හා සාමය ප්‍රකාශයට පත් කිරීම තීරණය කිරීම.**

(vi) **තානාපතිවරු පත් කිරීම තීරණය කිරීම.**

(vii) **ත්‍රිවිධ හමුදාපතිවරු පත් කිරීම තීරණය කිරීම.**

(viii) **රාජයේ උසස් නිලධාරින් පත් කිරීම තීරණය කිරීම.**

(ix) **මුදල් කොමිසම, මැතිවරණ කොමිසම, රාජ්‍යය භාෂා කොමිසම් වල සාමාජිකයන් පත් කිරීම තීරණය කිරීම.**

(x) **ආණ්ඩුකාරවරු පත් කිරීම තීරණය කිරීම.**

(xi) **විදේශසේවා නිළධාරීන් පත් කිරීම තීරණය කිරීම.**

● <u>අධිකරණ අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

- **උසස් අධිකරණ ආයතන වලට විනිශ්චයකාරවරු පත් කිරීම තීරණය කිරීම..**
- **වරදකරුවන්ට සමාව දීම තීරණය කිරීම.**
- **දඬුවම් අත්හිටුවීම තීරණය කිරීම.**
- **අග්‍රවිනිශ්චකාරයා පත් කිරීම තීරණය කිරීම.**

මෙම ආකාරයට ඉන්දියානු අගමැතිරයා ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ ත්‍රිවිධ ආයතන සතු විශාල බලතල ප්‍රමාණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හිමි කර දෙයි.

● <u>අගමැතිවරයාගේ තත්ත්වය (උපයෝගීතාවය).</u>

ඉන්දියානු අගමැතිවරයා ආණ්ඩුක්‍රමයට අනුව ඉතා බලවත් ධූරයක් වේ. නමුත් <u>වෙනත් කැබිනට් ආණ්ඩුක්‍රමයකට සාපේක්ෂව ඉන්දියානු අගමැතිවරයාගේ බලතල කිසියම් ප්‍රමාණයකට සීමා වේ</u>. ඊට බලපෑ හේතු,

1. **නාමික විධායකය වෙනත් රාජ්‍යයකට සාපේක්ෂව බලවත් වීම.**

2. **පක්ෂ ක්‍රමය.**

   ඉන්දියානු පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයකි. එම නිසා බොහෝ විට නිර්මාණය වන්නේ සභාග ආණ්ඩු වේ. එම තත්ත්වය තුළ අගමැතිවරයාගේ බලය තරමක් සීමා වේ. නිදසුන් ලෙස බ්‍රිතාන්‍යය තුළ ද්වි පක්ෂ ක්‍රමයක් පවතී. එම ක්‍රමය තුළ එක් පක්ෂයකින් ආණ්ඩුව බිහි වේ. එවැනි ක්‍රමයක් තුළ ශක්තිමත් අගමැති ධූරයක් නිර්මාණය වේ. නමුත් බහු පක්ෂ ක්‍රමය යටතේ අගමැති ධූරයේ බලතල කිසියම් ප්‍රමණයකට සීමා වේ.

3. **බලතල බෙදා හැරීම (සංඝීය ක්‍රමය)**

   ඒකීය ආණ්ඩුක්‍රමයක අගමැතිවරයාට විශාල බලතල ප්‍රමණයක් හිමි වේ. නමුත් ඉන්දියාව සංඝීය ක්‍රමයක් නිසා ඒකීය ක්‍රමයක අගමැතිවරයෙකුට සාපේක්ෂව අගමැතිවරයාගේ බලතල කිසියම් ප්‍රමාණයකට සීමා වේ. නිසුන් ලෙස බ්‍රිතාන්‍යය ආණ්ක්‍රමයේ සියලු අංශ සතු බලතල එක් මධ්‍යම ආණ්ඩුවකට ලබා දී ඇත. එම නිසා එම බලතල බ්‍රිතාන්‍යය අගමැතිවරයාට හිමි වේ. නමුත් බලතල බෙදන ලද සංඝීයක්‍රමයක් පවතින ඉන්දියාව තුළ අගමැතිවරයා සතු වන්නේ මධ්‍යම ආණ්ඩුවේ හා සමගාමී ලැයිස්තුවේ බලතල පමණි. එම නිසා බලතල කිසියම් ප්‍රමාණයක් සීමා සහිත වේ. එහෙත් ඉන්දියාව තුළ අර්ධ සංඝීය ස්වභාවයක් පවතින නිසා වෙනත් සංඝීය ක්‍රමයක අගමැතිවරයෙකුට සාපේක්ෂව ඉන්දියානු අගමැතිවරයා බලවත් වේ.

# කැ බිනට් මණ්ඩලය

| හැඳින්වීම. | |
| --- | --- |
| මොකක්ද | ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පිහිටුවා ඇති දේශපාලන විධායකය. ක්‍රියාකාරී විධායකය - සත්‍යය විධායකය කැබිනට් මණ්ඩලයයි. |
| සංයුතිය : | අගමැති ප්‍රමුඛ කැබිනට් අමාත්‍යවරුන්ගෙන් කැබිනට් මණ්ඩලය සකස්වෙයි. |
| පත් කිරීම : | කැබිනට් මණ්ඩලය සංවිධානය කිරීමේ මූලික කාර්යය වන්නේ අගමැති වරයා තෝරාපත් කිරීමයි. ව්‍යවස්ථාදායකයේ ලොක් සභාවේ වැඩිදෙනාගේ විශ්වාසය දිනා ගත් මන්ත්‍රීවරයා අගමැතිවරයා ලෙස ජනාධිපති විසින් තෝරාපත් කරයි. පසුව අගමැතිවරයා ගේ උපදෙස් මත සමස්ත ව්‍යවස්ථාදායකය තුළින් අමාත්‍ය මණ්ඩලය ජනාධිපතිවරයා තෝරාපත් කරයි. |
| නිලකාලයः | ඉන්දියානු දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයේ නිලකාලය වසර පහ (5) කි. |
| ඉවත් කිරීමः | නිලකාලය වසර (5) අවසන් වීමට පෙර කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකිය. කැබිනට් මණ්ඩලය පාලන කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට සාමූහිකව වගකිව යුතු ය. වග නොකියන අවස්ථාවල දී ව්‍යවස්ථාදායකයේ ලොක් සභාව තුළ සම්මත කළ විශ්වාස භංගයෝජනාවක් මගින් කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකිය. |

## ■ කැබිනට් මණ්ඩලයේ කාර්ය හා බලතල (භූමිකාව)

1. **ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීම.**

කැබිනට් මණ්ඩලය ප්‍රතිපත්ති සාකච්ඡාකරන සහ ඒවා සකස් කරන මණ්ඩලය යි. දේශීය හා විදේශීය වශයෙන් වැදගත් සෑම ප්‍රතිපත්තියක් ම මෙහි දී සාකච්ඡාවට ලක් කරයි. ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීමට අදාළව සිදු කරන වැදගත් කාර්යයන් තුනකි.

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කිරීම.
- අයවැය ලේඛණය සකස් කිරීම.
- ව්‍යවස්ථාදායකය සම්පාදනය කරන නීතිපවා මූලිකව තීරණය කිරීම.

2. **නීති ක්‍රියාත්මක කිරීම.**

කැබිනට් මණ්ඩලය නීති ක්‍රියාත්මක කරයි. ව්‍යවස්ථාදායකය විසින් සම්පාදිත නීති ක්‍රියාත්මක කරන්නේ කැබිනට් මණ්ඩලය විසිනි. වෙනත් ලෙසකට දක්වන්නේ නම් කැබිනට් මණ්ඩලය මූලිකව තීරණය කර ව්‍යවස්ථාදායකය ලවා සම්පාදනය කරවා ගත් නීති කැබිනට් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරයි.

3. **පරිපාන කටයුතු විධිමත් කිරීම.**

රාජ්‍යයේ කටයුතු විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ වලට බෙදා දක්වමින් එම දෙපාර්තමේන්තු අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම. ඒවා අතර ඇති වන ගැටුම් කළමණාකරණය කරමින් පරිපාලන කටයුතු විධිමත් කිරීම කැබිනට් මණ්ඩලය සතු කාර්ය භාරයකි.

**තවදුරටත්,**

4. **මුදල් තීරණය කිරීම.**

කෙසේ බදු පැනවිය යුතු ද? එම බදු කෙසේ අය කරගත යුතු ද? එම මුදල් කෙසේ වැය කළ යුතු ද යන්න කැබිනට් මණ්ඩලය තීරණය කරයි. බදු පැනවීම බදු අහෝසි කිරීම, බදු සංශෝධනය කිරීම ආදිය තීරණය කරනු ලබන්නේ කැබිනට් මණ්ඩලය විසිනි.

## ● සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.

සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කැබිනට් අමාත්‍යවරුන් පාලන කටයුතු සම්බන්ධයෙන් තනි තනිව නොව සාමූහිකව එනම්, කැබිනට් මණ්ඩලයක් ලෙස ව්‍යවස්ථාදායකයට වගකිව යුතු බවයි. සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය නිසා කැබිනට් මණ්ඩලයේ සහයෝගීතාවය සාමූහිකත්වය ඒකීය භාවය තහවුරු වේ. **ඉන්දියානු කැබිනට් මණ්ඩලය තුළ මෙම ප්‍රතිපත්තිය හොඳින් ආරක්ෂා වෙයි.** නමුත් බ්‍රිතාන්‍යයට සාපේක්ෂව තරමක අඩු ස්වභාවයක් හඳුනාගත හැකිය. ඊට ඉන්දියාවේ බහු පක්ෂ ක්‍රමය තුළ සභාග ආණ්ඩු නිර්මාණය වීම බලපා තිබේ.

## ● කැබිනට් මණ්ඩලයේ බලවත්භාවය

ඉන්දියානු ආණ්ඩුක්‍රමය තුළ නිර්මාණය කර ඇති බලවත් ආයතනක් ලෙස කැබිනට් මණ්ඩලය හඳුනාගත හැකි ය. සියලු විධායක ක්‍රියාවන් තීරණය කරනු ලබන්නේ කැබිනට් මණ්ඩලයයි. එය ඉතා බලවත් ආයතනයකි. නමුත් වෙනත් රාජ්‍යයක කැබිනට් මණ්ඩල සමඟ සැසඳීමේ දී ඉන්දීය කැබිනට් මණ්ඩලයේ බලතල සීමාවීමට බලපෑ හේතු කිහිපයකි.

(i) පක්ෂ ක්‍රමය.

ඉන්දියාව තුළ බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන බැවින් කැබිණට් මණ්ඩලය සකස් වන්නේ පක්ෂ කිහිපයක සාමාජිකත්වයෙනි. සභාග ආණ්ඩු පිහිටු වීම ලක්ෂණයකි. එවැනි තත්ත්වයක් තුළ කැබිනට් මණ්ඩලයේ ඒකීය භාවය, රහස්‍ය භාවය, ශක්තිය තරමක් දුරට සීමා වේ. බ්‍රිතාන්‍යය කැබිනට් මණ්ඩලය සමඟ තුලනාත්මකව විග්‍රහ කිරීමේ දී මෙය පැහැදිලි වේ.

(ii) බලතල බෙදීම.

ඉන්දියාව සංධීය රාජ්‍යයක් නිසා බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට හා මධ්‍යම ආණ්ඩුවට බෙදා තිබීම ලක්ෂණයකි. කැබිනට් මණ්ඩලයට හිමි වන්නේ මධ්‍යම ආණ්ඩුව සතු අංශ සහ සමගාමී බලතල ලැයිස්තුවේ අංශ සම්බන්ධ බලතල පමණි. එම නිසා ඒකීය ආණ්ඩුක්‍රමයක කැබිනට් මණ්ඩලයකට සාපේක්ෂව ඉන්දීය කැබිනට් මණ්ඩලයේ බලතල සීමා වේ.

# අධිකරණය

# අධිකරණය

## හැඳින්වීම.

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කේවල (එක්) අධිකරණ පද්ධතියක් පිහිටුවා තිබේ. සාමාන්‍යයෙන් සංඝීය රාජ්‍යයක අධිකරණ පද්ධති දෙකක් ක්‍රියාත්මක වුවද ඉන්දියාවේ ක්‍රියාත්මක වන්නේ එක් අධිකරණ පද්ධතියකි. මෙම කේවල අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණය වෙයි. ඒ සම්බන්ධ බලතල මධ්‍යම ආණ්ඩුව සතු කර තිබේ. පහළ අධිකරණ ආයතන වන්නේ මහ අධිකරණය - දිසා අධිකරණය - මහේස්ත්‍රාත් අධිකරණය - පංචායත් අධිකරණය - ප්‍රාථමික අධිකරණයයි. ඒ සම්බන්ධ බලතල ප්‍රාන්ත ආණ්ඩුව සතු කර තිබෙයි. ප්‍රාන්ත ආණ්ඩුවල ඉහළම අධිකරණය වන්නේ මහ අධිකරණයයි.

## අධිකරණ ව්‍යුහය

අධිකරණ ආයතන

- ඉහළ අධිකරණ ආයතන (මධ්‍යම ආණ්ඩුව)
  - ↓ ශ්‍රේෂ්ඨාධිකරණය
- පහළ අධිකරණ ආයතන (ප්‍රාන්ත ආණ්ඩුවලට)
  - ↓ මහ අධිකරණය
  - ↓ දිසා අධිකරණය
  - ↓ මහේස්ත්‍රාත් අධිකරණය
  - ↓ පංචායත් උසාවිය
  - ↓ ප්‍රාථමික අධිකරණය

## ● ශ්‍රේෂ්ඨාධිකරණය.

**හැඳින්වීම :**

**මොකක්ද :** ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපනය කර තිබේ. මූලික නීතියෙන් ස්ථාපනය කර ඇති නිසා බලවත් ආයතනයකි. එය එරට අධිකරණ ව්‍යූහයේ ඉහළම බලය සහිත ආයතනය වනවා පමණක් නොව ලෝකයේ ඇති බලවත් ශ්‍රේෂ්ඨාධිකරණ අතුරින් එකකි.

**සංයුතිය :** ආරම්භක අවස්ථාවක දී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයේ **සාමාජිකත්වය අග්‍රවිනිශ්චකාරවරයා ඇතුළු තවත් සහය විනිශ්චකරුවන් හත් (7) දෙනෙකුගෙන් සමන්විත විය. නමුත් වර්තමානය තුළ එය අග්‍රවිනිශ්චකාරයා සහ සහය විනිශ්චකරුවන් විසිපහකින් (25) සමන්විතය**. සාමාජිකත්වය අතින් ද ලෝකයේ ඇති බලවත් උසාවියක් බව කිව හැකිය.

**පත් කිරීම:** ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් කරනු ලබන්නේ ජනාධිපති අගමැතිගේ උපදෙස් මතය. විනිශ්චයකාරවරුන් පත් කිරීමේ දී ජනාධිපති අවශ්‍ය නම් අග්‍රවිනිශ්චයකාර වරයාගේ උපදෙස් ලබා ගත හැකිය. නමුත් එම උපදෙස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නොමැත. ජ්‍යෙෂ්ඨත්වය මත විනිශ්චකාරවරු පත් කිරීමේ සම්ප්‍රධාය ඉන්දියාව තුළ ද ක්‍රියාත්මක විය. 1973 ඉන්දිරා ගාන්ධි විසින් එම සම්ප්‍රදාය බිඳ දමා ඇත.

**නිදර්ශන :**

1973 ඉන්ධිරා ගාන්ධි ගේ ඉල්ලීම මත ජනාධිවරයා විසින් ශ්‍රේෂ්ඨ විනිසුරුවන් තුන් දෙනෙකු නොසලකා හරිමින් "ඒ.එන්.රේ" අග්‍රවිනිශ්චකාර ධූරයට පත් කිරීම.

**සුදුසුකම් :** ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු වීමට අවශ්‍ය සුදුසුකම් වන්න් **ඉන්දිය පුරවැසියෙකු වීම - වසර පහක (5) කාලයක් මහ අධිකරණ විනිශ්චයකාරයකු ලෙස සේවයක් තිබීම - නීතිඥවරයෙකු ලෙස වසර දහයක (10) කාලයක් මහ අධිකරණයේ සේවය කර තිබීම.**

**නිලකාලය:** ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම වයස් සීමාව අවුරුදු 65 කි. නමුත් ඊට පෙර අවශ්‍ය නම් ඉල්ලා අස්විය හැකිය.

**ඉවත් කිරීම:** විෂම පැවැත්ම - අබලතාවය වැනි හේතූන් මත විනිශ්චකාරවරයකු තනතුරින් ඉවත් කළ හැකිය. එය සිදුකළ හැක්කේ ඒ හා සම්බන්ධ යෝජනාව ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකෙන්ම (2/3) ක විශේෂ බහුතරයකින් සම්මත කොට ජනාධිපති අනුමැතිය මගිනි.

■ <u>ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

**1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විවරණය කිරීමේ බලය.**

අධිකරණ විවරණ බලය මගින් විස්තර වන්නේ ව්‍යවස්ථාධායකය පාර්ලිමේන්තුව සකස් කරන නීති වල ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂා කිරීමට අධිකරණයට ඇති හැකියාවයි. යම් නීතියක් ව්‍යවස්ථාව ට නොගැලපෙන්න් නම් එය බල රහිත කිරීමට, නිශේධනය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකිය.

**2. මූලික අධිකරණ බලය.**

<u>මූලික අධිකරණ බලය හිමි එකම අධිකරණ ආයතනය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ යයි</u>. මින් විස්තර වන්නේ, මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩුවක් අතර හෝ ප්‍රාන්ත ආණ්ඩු කිහිපයක් අතර පැන නගින අර්බුද විමසා බැලීම.

**3. අභියාචනාධිකරණ බලය.**

මේ යටතේ මහ අධිකරණය වැනි පහළ අධිකරණ ආයතන වල තීරණයක් සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම් එවැනි තීරණ සම්බන්ධ අභියාචනා සලකා බැලීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකිය. එය කොටස් තුනකින් යුක්තය. <u>ව්‍යවස්ථානුකූල කරුණු සම්බන්ධ අභියාචනා, සිවිල් කටයුතු සම්බන්ධ අභියාචනා, අපරාධ නඩු පිළිබඳ අභියාචනා</u>.

**4. මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ අධිකරණ බලතල.**

ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දීර්ඝ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් සටහන් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පුරවැසියන්ට ප්‍රදානය කරන ලද මූලික අයිතීන් ආරක්ෂා කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරී ඇත. එමෙන්ම මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය හෝ ප්‍රාන්ථ ආණ්ඩුවල ව්‍යවස්ථාදායකයන් විසින් මූලික අයිතිවාසිකම් කඩවන ලෙස පැනවූ නිති නිශේධනය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකිය.

**5. උපදේශක අධිකරණ බලය.**

ඉන්දියානු රාජ්‍යය නායකයා වන ජනාධිපතිවරයාට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් උපදෙස් පැතිය හැකිය. නිදසුන් ලෙස ප්‍රාන්ථ රාජ්‍යයන් සහ මධ්‍යම ආණ්ඩුව අතර අර්බුද පැන නැගුණු අවස්ථාවක් දැක්විය හැකිය. නමුත් මෙම උපදෙස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නැත.

**6. අතිරේක අධිකරණ බලය.**

ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව තුළ ඇති කර ගන්නා පනත් මගින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වෙනත් අතිරේක අධිකරණ බලතල එක් කිරීම මින් අර්ථවත් වේ.

● <u>අධිකරණයේ බලවත් භාවය.</u>

ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා බලවත් අධිකරණයක් ලෙස හඳුනාගත හැකිය. ලොව බලවත්ම අධිකරණය වන ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණයට නොමැති ඇතැම් බලතල මෙම ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වේ. එයට නිදසුන් ලෙස **<u>ඇමරිකානු කොංග්‍රසය මගින් ඉදිරිපත් කළ ව්‍යවස්ථා සංශෝධනයක් මේ දක්වා ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප නොකිරීමත්, ඉන්දියානු ව්‍යවස්ථාදායකය විසින් ඉදිරිපත් කළ සංශෝධනයන් ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කිරීමත් දැක්විය හැකිය</u>**.

# සංධීය ක්‍රමය

# ස ංධීය ක්‍රමය

පොදු හැඳින්වීම

ඉන්දියානු ආණ්ඩුක්‍රමය සංධීය ආණ්ඩුක්‍රමයකි. බලතල බෙදීමේ ස්වභාවය අනුව ලෝකය තුළ විවිධ සංධීය ආකෘති ක්‍රියාත්මක වන අතර ඉන්දියානු සංධීය ක්‍රමය ඒ අතර අපූර්වතම සංධීය ක්‍රමයකි. ඉන්දියාවේ සංධීය ක්‍රමයේ ඇරඹිය සටහන් වන්නේ බ්‍රිතාන්‍යය පාලන සමයේ ය. 1935 දී ආණ්ඩුක්‍රම පනත මගින් ඉන්දියාව තුළ සංධීය ක්‍රමයක් ස්ථාපනය කිරීමට ඉංග්‍රීසීන් කටයුතු කරන ලදි. 1947 ඉංග්‍රීසීන්ගෙන් නිදහස ලබාගත් ඉන්දියානුවන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරයි. ඒ තුළ සංධීය ක්‍රමය අඩංගු ලක්ෂණ ඒ ආකාරයෙන් ම හඳුනා ගත හැකිය.

හේතු :

ඉන්දීය ආණ්ඩුක්‍රමය සංධීය ආණ්ඩුක්‍රමයක් ලෙස නිර්මාණය කිරීමට බලපෑ හේතු සාධක විග්‍රහ කිරීම.

(i) විවිධ සංස්කෘතීන්ගෙන් යුත් ජනතාවක් ජිවත් වීම.

(ii) විශාල ජන සංඛ්‍යාවක් ජීවත්වීම.

(iii) වෙනස් සංස්කෘතීන්ට ගැලපෙන සේ පාලන කටයුතු පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය.

(iv) භූමිය අතින් විශාල රාජ්‍යයක් වීම.

ලක්ෂණ :

ඉන්දීය සංධීය ක්‍රමය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම සඳහා ඉන්දියානු සංධීය ක්‍රමයේ ලක්ෂණ හඳුනාගැනීම වැදගත් ය.

1. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍යම හා ප්‍රාන්ථ ආණ්ඩු අතර බලතල නිශ්චිතව බෙදා තිබීම.**

**ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යම හා ප්‍රාන්ථ ආණ්ඩු අතර** බලතල බෙදා හැර ඇත. ඒ සඳහා බලතල ලැයිස්තු තුනක් භාවිතා කර තිබේ.

(I) **මධ්‍යම ආණ්ඩුවේ බලතල ලැයිස්තුව.**
[මෙයට විෂයන් 97 (වර්තමානයේ 99) ඇතුලත් වේ]

(II) **ප්‍රාන්ථ රාජ්‍යය සතු බලතල ලැයිස්තුව.**
[මෙයට විෂයන් 66 (වර්තමානයේ 61) ඇතුලත් වේ]

(III) **සමගාමී බලතල ලැයිස්තුව**
[මෙයට විෂයන් 47 ක් (වර්තමානයේ 52 ක්) ඇතුලත් වේ]

## ● මධ්‍යම ආණ්ඩුවේ බලතල ලැයිස්තුව හා ඊට අදාළ තත්ත්වයන්.

**බලතල ප්‍රමාණය :**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යම ආණ්ඩුව නිර්මාණය කර එයට බලතල පවරා දී තිබේ. ආරම්භක අවස්ථාවේ දී විෂයන් **97** ක බලතල හිමි වුවද වර්තමානය තුළ එය විෂයයන් **99** ක් දක්වා ව්‍යාප්ත වී තිබේ.

**විෂයයන්:**

මධ්‍යම ආණ්ඩුව සතු විෂයන්, **ජාතික ආරක්ෂාව - හමුදා කටයුතු - යුද්ධය හා සාමය - විදේශ කටයුතු. මුදල්, අන්ර්ජාතික වෙළෙඳාම**, ආදී ජාතික වශයෙන් වැදගත් අංශවල බලතල මධ්‍යම ආණ්ඩුව සතුවෙයි.

**බලතල ක්‍රියාත්මක කරනත්‍රිවිධ ආයතන**

මෙම විෂයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ අංශ මධ්‍යම ආණ්ඩුව සතු වේ. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය වන්නේ පාර්ලිමේන්තුවයි. එය ද්විමාණ්ඩලික වේ. පළමු සභාව ලොක් සභාව වේ. දෙවන සභාව රාජ්‍ය සභාව වේ. මධ්‍ය ආණ්ඩුවේ විධායකයන් දෙකක් පවතී. නාමික විධායකය ජනාධිපතිවරයාය. දේශපාලන විධායකය අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි. මධ්‍ය ආණ්ඩුවේ අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි.

## ● ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල ලැයිස්තු හා ඊට අදාළ තත්ත්වයන්.

**බලතල ප්‍රමාණය -:**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාන්ත ආණ්ඩු 28 ක් පිහිටුවා ඇත. නමුත් ප්‍රායෝගිකත්වය තුළ ක්‍රියාත්මක වන්නේ ප්‍රාන්ත 26 ක් පමණි. මීට අමතරව සාංගමික ප්‍රදේශ 7 ක් දැකිය හැකිය. ආරම්භක අවස්ථාවේ දී විෂයයන් **66** ක බලතල හිමි වුවද වර්තමානය තුළ **61** දක්වා අඩුවී තිබේ.

**විෂයයන්**

ප්‍රාන්ත ආණ්ඩු සතු කර ඇති විෂයයන්, **අධ්‍යාපනය - සෞඛ්‍යය - ප්‍රවාහනය - කෘෂිකාර්මාන්තය - ධීවර කටයුතු - මහජන සාමය - හිරගෙවල්** ආදී ප්‍රාදේශීය අංශවල බලතල ප්‍රාන්ත රාජ්‍යයන් සතු කර තිබේ.

**බලතල ක්‍රියාත්මක කරනත්‍රිවිධ ආයතන**

මෙම විෂයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ අංශ ප්‍රාන්ත රාජ්‍යය සතු වේ. ප්‍රාන්ත ආණ්ඩුවල ව්‍යවස්ථාදායකය සැලකූ විට ඇතැම් ඒවා ඒක මාණ්ඩලික වේ. ඇතැම් ඒවා ද්විමාණ්ඩලික වේ. ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයන් හඳුන්වනු ලබන්නේ ව්‍යවස්ථාදායක සභාව හෙවත් **විධාන් සභාව** යනුවෙනි. ප්‍රාන්ත කිහිපයන පමණක් ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයන් පවතී. එහි දෙවැනි මණ්ඩලය හඳුන්වනු ලබන්නේ ව්‍යවස්ථාදායක කවුන්සිලය හෙවත් **විධාන් පර්ශද් සභාව** යනුවෙනි. ප්‍රාන්ත ආණ්ඩුවල විධායකය සැලකූ විට දේශපාලන විධායකය හා නාමික විධායකය වශයෙන් ආකාර දෙකකි. දේශපාලන විධායකය මහ ඇමති ප්‍රමුඛ ඇමති මණ්ඩලයයි. නාමික විධායකය ආණ්ඩුකාරවරයා ය. ප්‍රාන්ත ආණ්ඩුවල අධිකරණය සැලකූ විට මහ අධිකරණය ප්‍රමුඛ පහළ අධිකරණ ආයතනවලින් යුක්ත ය.

● සමගාමී බලතල ලැයිස්තුව හා ඊට අදාළ තත්ත්වයන්.

බලතල ප්‍රමාණය : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යම ආණ්ඩුවටත් ප්‍රාන්ථ ආණ්ඩු වලටත් භුක්තිවිඳිය හැකි සමගාමී බලතල ලැයිස්තුවක් දක්වා තිබේ. ආරම්භක අවස්ථාවේ දී විෂයයන් 47 ක බලතල හිමි වුවද වර්තමානය තුළ විෂයයන් 52 ක් දක්වා ව්‍යපාත් වී තිබේ.

විෂයයන් මෙම සමගාමී බලතල ලැයිස්තුවේ දක්වා ඇති විෂයයන්, **ආර්ථික - සමාජ - කම්කරු - මිළ පාලනය - දික්කසාද - පුවත්පත් - වෘත්තීය සමිති - කර්මාන්ත ශාලා** ආදී අංශවල බලතල සමගාමී බලතල ලැයිස්තුව සතු කර තිබේ.

බලතල ක්‍රියාත්මක කරන ත්‍රිවිධ ආයතන මෙම විෂයන් සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවට මෙන්ම ප්‍රාන්ථ ආණ්ඩුවලට ක්‍රියාත්මක වීමට ත්‍රිවිධ ආයතනන් පවතී. සමගාමී බලතල ලැයිස්තුවේ යම් කරුණක් සම්බන්ධයෙන් අර්බුධයක් ඇතිවුවහොත් එහි දී මධ්‍යම ආණ්ඩුව බලවත් වේ.

බලවත්වන ආකාරය හඳුනාගත හැකිය. එය අර්ධ *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල ලැයිස්තු තුනක් මගින් බලතල බෙදා ඇත. බලතල ලැයිස්තුවේ දක්වා නොමැති අංශයක් වේ නම් ඒ සම්බන්ධ බලතල මධ්‍ය ආණ්ඩුව සතු වේ. මෙලෙස ඉන්දියානු සංධීය ක්‍රමය තුළ මධ්‍ය ආණ්ඩුව සංධීය ක්‍රමයක් ලෙස ද විචාරකයෝ හඳුන්වති.*

**2. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.**

සංධීය ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත වීම අනිවාර්ය සාධකයකි. ඊට හේතුව වන්නේ මධ්‍ය හා ප්‍රාන්ථ ආණ්ඩු සතු බලත පැහැදිලිව සටහන් තැබීමට අවශ්‍ය වීමයි. ඉන්දීය ආණ්ඩුක්‍රමය ද ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. එය ලොව ඇති දීර්ඝතම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ. **එහි වගන්ති 395 ක් (වර්තමානයේ 448ක්) පරිච්ඡේද 22 ක් (වර්තමානයේ 25ක්) උපලේඛන 12 ක් සහ ඇමුණුම් 03 ක් ද ඇතුලත් වේ.**

**3. ව්‍යවස්ථාවේ අනම්‍ය භාවය.**

සංධීය ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වීම අනිවාර්ය සාධකයකි. ඊට හේතුව වන්නේ මධ්‍ය ආණ්ඩුව හිතුවක්කාරී ලෙස ව්‍යවස්ථාව සංශෝධනය කරමින් බලතල වර්ධනය කර ගැනීම ලොප් කිරීමයි. එම ආකාරයට ඉන්දීය ආණ්ඩුක්‍රමය ද අනම්‍ය ආණ්ඩුක්‍රමයක් වේ. එයත් ඉන්දීය සංධීය ක්‍රමයේ ලක්ෂණයකි.

4. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරත්වය.**

සංධීය ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතරවීම අනිවර්ය සාධකයකි. ඉන්දීය ආණ්ඩුක්‍රමය තුළ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය තහවුරු කර තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉහළින් පවතින වෙනත් කිසිදු නීතියක් ඉන්දියානු සමූහාණ්ඩු දේශසීමාව තුළ නොමැත.

5. **අධිකරණය බලවත් වීම.**

සංධීය ක්‍රමයක අධිකරණය බලවත් විය යුතු ය. එම ලක්ෂණය ද ඉන්දීය සංධීය ක්‍රමය තුළ හඳුනා ගත හැකිය. ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය බලවත් අධිකරණ ආයතනය වේ. මෙ අධිකරණයට අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය හිමිවේ. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල මත ගැටුමක් ඇතිවුවහොත් එය නිරාකරණය කරනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි.

6.**ද්විත්ව පාලන ක්‍රමයක පැවැත්ම තහවුරු වී තිබීම.**

සංධීය ක්‍රමයක ද්විත්ව පාලන ක්‍රමයක පැවැත්ම තහවුරු කර තිබීම ලක්ෂණයකි. ඉන්දීය සංධීය ක්‍රමය තුළ එම පැවැත්ම තහවුරු කර තිබේ. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු වෙන වෙනම ක්‍රියාත්මක වේ. ඒ සඳහා ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ ආයතන මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු සතුය.

7. **මධ්‍යම ආණ්ඩු තුළ ප්‍රාන්ත රාජ්‍යයන්ට නියෝජනයක් ලැබීම.**

සංධීය ක්‍රමයක මධ්‍යම ආණ්ඩුව තුළ ප්‍රාන්ත රාජ්‍යයන්ට නියෝජනයක් ලබාදීම ප්‍රධාන ලක්ෂණයකි. එය ඉන්දීය සංධීය ක්‍රමය තුළ හඳුනාගත හැකිය. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාධායකය තුළ දෙවන සභාව රාජ්‍ය සභාව ඒ සඳහා නිර්මාණය කර ඇත. ප්‍රාන්ත රාජ්‍යය වල ජනගහනයේ ප්‍රමාණය මත රාජ්‍ය සභාව සඳහා ඒ ඒ ප්‍රාන්ත වලින් නියෝජිතයන් තෝරාපත් කරයි. එහි සාමාජික සංඛ්‍යාව 250 කි.

ඉහත දැක්වූ විධිවිධාන මගින් පරිපූර්ණ සංධීය ක්‍රමයක පැවතිය යුතු සෑම ගුණාංගයක්ම ඉන්දීය සංධීය ක්‍රමය තුළ අඩංගු බව පැහැදිලිය. නමුත් ප්‍රායෝගික භාවිතාව තුල දී එම සංධීය ලක්ෂණ යටපත් වී මධ්‍යම ආණ්ඩුව බලවත් වූ තත්ත්වයක් ඉන්දීය සංධීය ක්‍රමය තුලින් ප්‍රකට වේ. එම නිසා එය අර්ධ සංධීය ක්‍රමයක් ලෙස විචාරකයන් ප්‍රකාශ කරයි. ඉන්දියානු ආණ්ඩුක්‍රම සම්පාදන මණ්ඩලයේ සභාපති වරයා "අම්බෙඩ්කාර්" ප්‍රකාශ කරන්නේ, ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්භාව්‍ය සංධීය මූලධර්ම මත සකස් කළ එකක් නොවන බවය. **එය ගොඩනගා ඇත්තේ සාමාන්‍ය තත්ත්වය තුළ සංධීය ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වීමටත්, හදිසි තත්ත්වයක් යටතේ ඒකීය ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වීමත් අරමුණු කොට ගෙනය.**

# අ රධ සංඝීය ක්‍රමය.

පොදු හැඳින්වීම.

- ඉන්දියාව සංඝීය රාජ්‍යයකි. (සංඝීය රාජ්‍යයක් බව දක්වන්න.)

- නමුත් මෙය සම්භාව්‍ය සංඝීය ක්‍රමයක් නොවේ. ඒ බව ආණ්ඩුක්‍රම සම්පාදන මණ්ඩලයේ සභාපතිවරයා අම්බෙක්කාර් මහතා ද ප්‍රකාශ කරයි. මෙය භාවිතාව තුළ අර්ධ සංඝීය ස්වභාවයක් ගන්නා බව විචාරක මතයයි. එයට හේතු වන්නේ මධ්‍යම ආණ්ඩුව විශාල ලෙස බලවත් වීමයි. එම නිසා ඉන්දීය ආණ්ඩුක්‍රමය අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් ලෙස ද විග්‍රහ කළ හැකිය.

ලක්‍ෂණ :

ඉන්දියානු ආණ්ඩුක්‍රමය තුළ ඇති ඇතැම් ලක්‍ෂණ අධ්‍යනය කිරීමේ දී පැහැදිලි වන්නේ එය අර්ධ සංඝීය ස්වභාවයක් දරණ බවයි.

1. **ප්‍රාන්ත ආණ්ඩු සතු අංශ (විෂයන්) සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමේ බලතල මධ්‍යම ආණ්ඩුවට පැවතීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාන්ත රාජ්‍යයන් සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමේ පූර්ණ බලතල ප්‍රාන්ත ආණ්ඩු සතු කර තිබේ. නමුත් ප්‍රායෝගික තත්ත්වය තුළ එබඳු පූර්ණ බලතල ප්‍රාන්ත ආණ්ඩු සතු නොවේ. **ඊට බලපෑ හේතු කිහිපයකි.**

- ප්‍රාන්ත රාජ්‍යය බලතල ලැයිස්තුවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් නීති පැනවීමට මධ්‍යම ආණ්ඩුවට බලය තිබීම.

- ප්‍රාන්ත රාජ්‍යයන් විසින් පනවන පනත් කෙටුම්පත් රඳවා තබා ගැනීමට, නිශේධ කිරීමට මධ්‍යම ආණ්ඩුවේ ජනාධිපතිවරයාට හැකිවීම.

- මධ්‍ය ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ රාජ්‍යය සභාව විසින් 2/3 ක විශේෂ බහුතර අනුමැතියකින් ප්‍රාන්ත රාජ්‍යය සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමේ බලය එක් වසරකට මධ්‍ය ආණ්ඩුවට පැවරිය හැකිවීම.

  මෙම තත්ත්වය මත ප්‍රායෝගික භාවිතය තුළ මධ්‍ය ආණ්ඩුව බලවත් වේ. එම නිසා ඉන්දීය සංඝීය ක්‍රමය අර්ධ සංඝීය ක්‍රමයක් ලෙස අර්ථකතනය කළ හැකිය.

2. **සමගාමී බලතල ලැයිස්තුවේ බලතල සම්බන්ධ ගැටළුවක දී මධ්‍ය ආණ්ඩුව බලවත් වීම.**

සමගාමී බලතල ලැයිස්තුව සම්බන්ධ විෂයන් සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමේ බලය මධ්‍ය ආණ්ඩුවට මෙන්ම ප්‍රාන්ත ආණ්ඩුවලටද තිබේ. නමුත් සමගාමී බලතල ලැයිස්තුවේ බලතල සම්බන්ධයෙන් ගැටළුවක් මතු වුවහොත් බලාත්මක වන්නේ මධ්‍ය ආණ්ඩුවේ තීරණය වේ. තව දුරටත් සමගාමී බලතල ලැයිස්තුව සම්බන්ධයෙන් ප්‍රාන්ත ආණ්ඩු සම්පාදනය කරගත් නීතියක් මධ්‍ය ආණ්ඩුව සකස් කරන නීතියක් මගින් සංශෝධනය කළ හැකිය. මුළුමනින්ම බල රහිත කළ හැකිය.

3. **ජනාධිපතිවරයා සතු වන බලතල මගින්.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන අන්දමට ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයන් විසින් සකස් කරන පනත් නීතිවීම සඳහා ප්‍රාන්ත නාමික විධායකය වන ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය අවශ්‍යවේ. ආණ්ඩුකාරවරයා මධ්‍ය ආණ්ඩුවේ නාමික විධායක ජනාධිපතිවරයාගේ නියෝජිතයාය. ඇතැම් පනත් ආණ්ඩුකාරවරයා විසින් මධ්‍යම ආණ්ඩුවේ නාමික විධායකයේ අනුමතිය සඳහා යැවිය යුතුය. එවැනි පනත් වලට විදසුන් ලෙස ,

**නිදර්ශනඃ** - මහාධිකරණයේ තත්ත්වය පිළිබඳ බලපාන පනත්
- දේපල පවරාගැනීම පිළිබඳ පනත්
- රාජ්‍ය හදිසි අවස්ථාවකදී හෝ ප්‍රාන්ත හදිසි අවස්ථාවක ප්‍රකාශ කර ඇතිවිට පනවන සියළු අණපනත්

මින් පැහැදිලි වන්නේ ප්‍රාන්ත ආණ්ඩුවලට ස්වාධීනව නීති සම්පාදනයේ අවකාශය නොමැති බවයි. ප්‍රාන්ත ආණ්ඩුවේ පනත් **සංශෝධනය කරන මෙන් නැවත හරවා යැවීමට - රඳවා තබා ගැනීමට - නිශේධනය කිරීමට** ජනාධිපති වරයාට හැකිය.

මෙම තත්ත්වය මත මධ්‍යම ආණ්ඩුව බලවත් වන නිසා එය අර්ධ සංඝීය රාජ්‍යයක් ලෙස හඳුනාගත හැකිය.

4. **අධිකරණ බලතල මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු අතර සමාන පදනමකින් බෙදා නොතිබීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අධිකරණ බලතල මධ්‍ය හා ප්‍රාන්ථ ආණ්ඩු අතර සමාන පදනමකින් බෙදා හැර නොමැත. **නිදසුන් ලෙස,**

**නිදර්ශන** - කේවල අධිකරණ පද්ධතීන් ක්‍රියාත්මක වන ඉන්දියාව තුළ උසස්ම අධිකරණ ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධ බලතල මධ්‍යම ආණ්ඩුව සතු වීම.

- ප්‍රාන්ත වල උසස්ම අධිකරණය වන මහ අධිකරණයට විනිසුරුවන් පත් කිරීමේ බලය මධ්‍ය ආණ්ඩුව සතු වීම.

- මහ අධිකරණයේ විනිසුරුවරුන් අගවිනිසුරු වරයාගේ උපදෙස් ඇතිව මාරු කිරීමට ජනාධිපති වරයාට හැකිවීම.

5. **ඉන්දීය සේවාවන් පාලනය කිරීමේ බලය මගින්.**

ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සේවාවන් කාණ්ඩ දෙකකි. <u>මධ්‍ය ආණ්ඩුවේ සේවාවන් සහ ප්‍රාන්ත රාජ්‍ය සේවාවන්</u> එම කාණ්ඩ දෙකයි. මීට අමතරව <u>සමස්ත ඉන්දියාව කෙරෙහි බලපාන සේවා කාණ්ඩයක් පවතී</u>. **පොලිස් සේවාව, සිවිල් සේවාව,** මීට නිදසුන් වේ. මේවා සම්බන්ධ පූර්ණ බලතල මධ්‍යම ආණ්ඩුව සතු වේ.

6. **ප්‍රාන්ත ආණ්ඩුකාරවරයා හරහා.**

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ප්‍රාන්ත රාජ්‍යයේ නාමික විධායකය ආණ්ඩුකාර වරයායා</u>. මධ්‍යම ආණ්ඩුව විසින් පත් කරන ආණ්ඩුකාරවරයා එම ප්‍රාන්තයේ මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතයා වේ. ආණ්ඩුකාරවරු පත් කිරීම, ඉවත් කිරීම, මාරු කිරීම සතු පූර්ණ බලතල ජනාධිපතිවරයා සතු වේ. ආණ්ඩුකාරවරයා ප්‍රාන්තයේ දේශපාලන වාතාවරණය මධ්‍ය ආණ්ඩුවේ ජනාධිපතිවරයාට දැනුම් දෙයි. මධ්‍ය ආණ්ඩුවට අවනත නොවන ප්‍රාන්ත ඒ හරහා විසුරුවයි. ප්‍රාන්ත ව්‍යවස්ථාදායක නිර්මාණය කරන පනත් නීති වන්නේ මධ්‍ය ආණ්ඩුවේ නියෝජිතයා වන ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සමගිනි. ඇතැම් පනත් සඳහා මධ්‍ය ආණ්ඩුවේ ජනාධිපතිවරයාගේ අනුමැතිය ද අවශ්‍යය වේ.

මෙම තත්ත්වය මත මධ්‍ය ආණ්ඩුව විශාල ලෙස බලවත් වී සිටී. එම නිසා ඉන්දියාව අර්ධ සංඝීය ක්‍රමයක් ලෙස සැලකිය හැකිය.

7. **නොලියන ලද බලතල මධ්‍ය ආණ්ඩුව සතු කර තිබීම.**

ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල දක්වා ඇත්තේ ලැයිස්තු තුනක් පදනම් කොටගනෙය.

(I) **මධ්‍යම ආණ්ඩුවේ බලතල ලැයිස්තුව.**
[මෙයට විෂයන් 97 (වර්තමානයේ 99) ඇතුලත් වේ]

(II) **ප්‍රාන්ත රාජ්‍යය සතු බලතල ලැයිස්තුව.**
[මෙයට විෂයන් 66 (වර්තමානයේ 61) ඇතුලත් වේ]

(III) **සමගාමී බලතල ලැයිස්තුව**
[මෙයට විෂයන් 47 ක් (වර්තමානයේ 52 ක්) ඇතුලත් වේ]

මෙම බලතල ලැයිස්තු තුන තුළ සටහන් කළ නොමැති යම් විෂයක් වේ ද එම අංශ සම්බන්ධ පූර්ණ බලතල මධ්‍ය ආණ්ඩුව සතු වේ.

8. **වැදගත් අංශ සතු බලතල මධ්‍ය ආණ්ඩුව සතු කර තිබීම.**

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යම ආණ්ඩුවේ බලතල ලැයිස්තුව ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල ලැයිස්තුව, සමගාමී බලතල ලැයිස්තුව ආදී වශයෙන් බලතල බෙදා ඇත. ජාතික වශයෙන් වැදගත් අංශ සම්බන්ධ බලතල පවරා ඇත්තේ මධ්‍ය ආණ්ඩුවටයි. ප්‍රාදේශීය අංශ සතු බලතල ප්‍රාන්ත රාජ්‍යයන්ට පවරා ඇත</u>.

**නිදර්ශන**

ජාතික ආරක්ෂාව, මුදල්, විදේශ කටයුතු, හමුදා කටයුතු, යුද්ධය හා සාමය, අතිරේක වෙළෙඳාම, <u>ජාතික වශයෙන් වැදගත් අංශ මධ්‍ය ආණ්ඩුව</u> සතු වීම අධ්‍යාපන, සෞඛ්‍යය, ප්‍රවාහන, පොලීසිය, හිරගෙවල් ආදී <u>ප්‍රාදේශීය අංශ ප්‍රාන්ත ආණ්ඩුව</u> සතු වීම.

මුදල් අංශය තුළ දී ප්‍රාන්ත රාජ්‍යය මධ්‍ය ආණ්ඩුව මත යැපෙන තත්ත්වයකට පත් කර තිබීම. ප්‍රාන්ත රාජ්‍යයන්ට මුදල් බලතල ලබාදී ඇත්තේ සීමිත වශයෙනි. ප්‍රධාන බදු පැනවීමේ බලය මධ්‍ය ආණ්ඩුව සතු වීම.

මුදල් කොමිසම ප්‍රාන්ප රාජ්‍යයන්ට මුදල් ලබාදීමේ දී අනුගමනය කළ යුතු විධිමත් ප්‍රතිපත්ති මාලාවක් නොමැතිවීම. මුදල් කොමිසම මගින් ද සිදුවන්නේ ප්‍රාන්ත රාජ්‍යයන් මධ්‍යම ආණ්ඩුවට යටත් කිරීමකි.

8. **හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම මගින්.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීමේ බලය රාජ්‍ය නායකයා ජනාධිපතිවරයා සතු කර තිබේ.

**හදිසි තත්ත්වය අවස්ථා තුනක දී ප්‍රකාශ කළ හැකිය.**

(i) **රාජය හදිසි අවස්ථා (352)**
(ii) **ප්‍රාන්ත හදිසි අවස්ථා (356)**
(iii) **මූල්‍ය හදිසි අවස්ථා (360)**

මෙම හදිසි අවස්ථා තත්ත්වයන් තුලදී ද මධ්‍ය ආණ්ඩුව බලවත් වී ප්‍රාන්ත රාජ්‍යයන් වල බලය සීමා වේ.

**නිදර්ශන ලෙස,**

රාජ්‍යය හදිසි අවස්ථාව,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට ඉන්දියාව තුළ **යුධමය තත්ත්වයක දී, ආයුධ සන්නද්ධ කැරැල්ලක දී,** බාහිර ආක්‍රමණයක දී මෙම රාජ්‍යය හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරයි. රාජ්‍යය හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කළ විට ඉන්දියානු සංධීය ආණ්ඩුක්‍රමය ඒකීය ආණ්ඩුක්‍රමයක් බවට පරිවර්ථනය වේ. සමස්ත ඉන්දියාවටම බලපාන ආකාරයට නීති පැනවීමට මධ්‍ය ආණ්ඩුවට හැකි වේ. රාජ්‍යය හදිසි අවස්ථාව ක්‍රියාත්මක කළ හැක්කේ මාස 6 ක කාලයක් පමණි. ඉන් පසුව එය ලොක් සභාව අනුමත නොකළ හොත් අහෝසි වේ. **රාජ්‍යය හදිසි අවස්ථාව ක්‍රියාත්මක කළ අවස්ථාවන්ට නිදර්ශන**

**1962 - ඉන්දු - චීන දේශසීමා යුද්ධය පැවති අවස්ථාව.**
**1971 - බංග්ලාදේශයේ නිදහස් අරගලය පැවති අවස්ථාව**
**1975 - 77 - ඉන්දිරාගාන්ධි පාලන සමය**

ප්‍රාන්ත හදිසි අවස්ථාව,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට **යම් ප්‍රාන්ථයක ව්‍යවස්ථානුකුල පාලනය බිඳවැටී ඇත්නම්, බිඳවැටිමට** ආසන්න යැයි ජනාධිපතිට **හැඟන්නේ නම්** එවැනි ප්‍රාන්ත රාජ්‍යයන් සම්බන්ධයෙන් ප්‍රාන්ත හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කළ හැකිය. ප්‍රාන්ත හදිසි අවස්ථාව ප්‍රකාශ කළ පසු එම ප්‍රාන්තය සම්බන්ධයෙන් ව්‍යස්ථාදායක, විධායක කටයුතු ක්‍රියාත්මක කිරීමේ බලතල ජනාධිපතිවරයාට පැවරීමට ලොක් සභාවට බලය තිබේ. **ප්‍රාන්ත හදසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීමට අදාළ නිදර්ශන**

**පංජාබ් ප්‍රාන්තයේ පාලන බලය ජනාධිපතිවරයා යටතට පත් කිරීම.**

**ජම්බු - කාශ්මීර ප්‍රාන්තයේ බලතල ජනාධිපතිවරයාට පැවරීම.**
**(ඉන්දු - පාකිස්ථාන යුද්ධ පැවති අවස්ථාව)**

**තමිල්නාඩු ප්‍රාන්තයේ පාලන බලතල ජනාධිපතිවරයාට පැවරීම.**
**(රජීව් ගාන්ධි ඝාතනය කළ අවස්ථාව)**

**මූල්‍ය හදිසි අවස්ථාව,**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයට **සමස්ත ඉන්දියාවේම හෝ කොටසක මූල්‍ය අර්බුදයක් පැන නැගී ඇතැයි ජනාධිපතිවරයාට හැඟී යන්නේනම්,** එවැනි අවස්ථාවක මූල්‍ය හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරයි. මූල්‍ය හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කර ඇති මොහොතක ප්‍රාන්ය රාජ්‍යයන්ට පවරා දී ඇති මූල්‍ය බලතල ක්‍රියාවට නැංවීමේ බලය මධ්‍ය ආණ්ඩුව සතු වේ.

*මෙම ආකාරයට හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කර ඇති මොහොතක ඉන්දියාවේ සංධීය ස්වභාවය අකර්මන්‍ය වේ. එවැනි තත්ත්වයක් තුළ ක්‍රියාත්මක වන්නේ අර්ධ සංධීය තත්ත්වයක් හෝ ඒකීය තත්ත්වයකි.*

09. **ඒකීය පුරවැසිභාවය**

**සම්භාව්‍ය සංධීය ක්‍රම තුළ ද්විත්ව පුරවැසිභාවයක් දැකිය හැකි අතර ඉන්දියාව තුළ දැකිය හැක්කේ ඒකීය පුරවැසිභාවයකි.** සම්භාව්‍ය සංධීය ආණ්ඩුක්‍රමයක් තුළ මධ්‍යම ආණ්ඩුවේ සාමාජිකත්වය මෙන්ම තමන් ජීවත් වන ප්‍රන්තයේ සාමාජිකත්වය ද පුරවැසියන්ට හිමිවේ. නමුත් ඉන්දියානු ව්‍යවස්ථාවට අනුව පුරවැසියන්ට හිමිවන්නේ ඒකීය පුරවැසි භාවයකි. එනම් මධ්‍යම ආණ්ඩුවේ පුරවැසි භාවය පමණි.

මේ ආකාරයට පුරවැසිභාවය නිසාද මධ්‍යම ආණ්ඩුව බලවත් වී ප්‍රාන්ත ආණ්ඩු බලවත් භාවයෙන් අඩුවේ. එම නිසා ඉන්දීය ආණ්ඩුක්‍රමය අර්ධ සංධීය ක්‍රමයක් ලෙස අර්ථකතනය කළ හැකිය. නොඑසේ නම් සංධීය ලක්ෂණ සහිත ඒකීය ක්‍රමයක් ලෙස ද අර්ථ කථනය කළ හැකිය.

10. **ප්‍රාන්ත මහ ඇමතිවරුන්ට එරෙහිව කොමිසන් සභා පත් කිරීම.**

ප්‍රාන්තවල මහ ඇමතිවරුන්ට එරෙහිව කොමිසන් සභාපත් කිරීම මගින් ප්‍රාන්ත රාජ්‍යය පරිපාලනයට මධ්‍ය ආණ්ඩුව මැදිහත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පැවරෙන කාර්යයන් ඉටු නොකිරීම සහ ඉටු කරන කාර්යයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නොගැලපීම යන චෝදනා මත ප්‍රාන්ත මහ ඇමතිවරුන්ට එරෙහිව කොමිසන්සභා පත්කර එම ප්‍රාන්තයේ පරිපාලන කටයුතු වලට මධ්‍යම ආණ්ඩුවට සම්බන්ධ විය හැකිය. ඒ හරහා ද මධ්‍යම ආණ්ඩුව බලවත් වේ.

නිදර්ශන,

**සකාරියා කොමිසම** - තමිල්නාඩු ප්‍රාන්තයේ කරුණානිධි පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසම.

**ධර්මාන් කොමිසම** - ත්‍රිපුර මහ ඇමති සෙන් ගුණා පිළිබඳව සොයා බැලීමට පත් කළ කොමිසම.

ඉහත ලාක්ෂිණකයන් අධ්‍යයනය කිරීම තුළින් ඉන්දීය ආණ්ඩුක්‍රමය අර්ධ සංධීය ආණ්ඩුක්‍රමයක් ලෙස නිගමනය කළ හැකිය. නොඑසේනම් සංධීය ලක්‍ෂණ සහිත ඒකීය ආණ්ඩුක්‍රමයක් ලෙස ද විග්‍රහ කළ හැකිය.

- **<u>මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු අතර ඇති සම්බන්ධතා.</u>**

1. රාජ්‍යය සභාව හරහා
2. ආණ්ඩුකාරවරයා හරහා
3. ජනාධිපතිවරයා පත් කිරීම හරහා
4. හදිසි අවස්ථාවලදී.
5. විදේශීය ගිවිසුම් හරහා
6. අධිකරණ අංශයේ දී
7. ප්‍රාන්ථ ආණ්ඩු සම්බන්ධයෙන් නීති සම්පාදනයට මධ්‍යය ආණ්ඩුවට හැකිවීම.
8. මුදල් කොමිසම හරහා

(**N.B** මෙම තත්ත්වයන් විස්තර කරන්න.)

# ඊ ක්‍ෂ ක්‍රමය

# ඉන්දියාවේ පක්ෂ ක්‍රමය

- <u>ඉන්දියානු පක්ෂක්‍රමයේ ඉතිහාසය</u>

ඉන්දියානු දේශපාලන පක්ෂ වලට දීර්ඝ ඉතිහාසයක් නොමැත. බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබාගැනීමට පූර්ව යුගය තුළ දේශපාලන පක්ෂක්‍රමයේ ආරම්භය සිදු විය. 1947 කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ආරම්භයත් සමඟ පක්ෂක්‍රමය විකාශනය විය.

- <u>ඉන්දියානු පක්ෂක්‍රමය බහු පක්ෂ ක්‍රමයකි.</u>

ඉන්දියානු පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයකි. බහු පක්ෂ ක්‍රමයක් යනුවෙන් අර්ථවත් කරනු ලබන්නේ යම් දේශපාලන ක්‍රමයක් තුළ දේශපාලන පක්ෂ දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් තීරණාත්මක ක්‍රියා කලාපයක් ඉටුකරන තත්ත්වයකි. වෙනත් ආකාරයකට දක්වන්නේ නම් ආණ්ඩු බලය දිනාගැනීම සඳහා හැකියාව ඇති දේශපාලන පක්ෂ කිහිපයක් පැවතීම බහු පක්ෂ ක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය.

නිදර්ශන :

- ඉන්දීය කොංග්‍රස් පක්ෂය
- භාරතීය ජනතා පක්ෂය
- ජනතා ඩාල් පක්ෂය
- ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය
- තෙලිඟු දේශම් පක්ෂය
- සිවසේනා පක්ෂය
- සිකීම් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ

□ **මෙම දේශපාලන පක්ෂ ප්‍රධාන කොටස් දෙකකට බණ්ඩනය කළ හැකිය.**

**I ජාතික මට්ටමේ දේශපාලන පක්ෂ**

සමස්ත ඉන්දියාව පුරා හෝ වැඩි කොටසක ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ දේශපාලන පක්ෂ ලෙස නිර්වචනය කළ හැකිය.

**II ප්‍රාදේශීය (ප්‍රාන්තීය) දේශපාලන පක්ෂ**

ප්‍රාන්ත පදනමින් ක්‍රියාත්මක වන පක්ෂ ප්‍රාන්තීය දේශපාලන පක්ෂ හෙවත් ප්‍රාදේශීය දේශපාලන පක්ෂ ලෙස හඳුනාගත හැකිය.

- **ඉන්දීය පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයක් ලෙස නිර්මාණයවීමට බලපෑ හේතු**

    - **ඉන්දීය සමාජය තුළ ඇති බහුවිධ ස්වභාවය**

      ලෝකයේ ඇති අතිවිශාලතම ප්‍රජාතන්ත්‍රීය රාජ්‍යය ඉන්දියාවයි. එය බහු වාර්ගික - බහු භාෂාමය - බහු ආගමික - බහු සංස්කෘතික ලාක්ෂණිකයන්ගෙන් නිර්මාණය වූවකි. සමාජයක් ලෙස පවතින පවතින බහුවිධ ස්වභාවය ඉන්දීය පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයක් වීමට හේතු විය.

      නිදර්ශන : <u>ඉන්දියාව තුළ භාෂා දහස් ගණනක් පවතී.</u> (2001 සංගණනයට අනුව 1652 කි.) හින්දි - බෙංගාලි - මරාති - උර්දු - ගුජරාටි - බංජාබ් - සංස්කෘත නිදර්ශන ලෙස දැක්විය හැකිය.

      <u>ඉන්දියාව ආගමික බහුවිධතාවයකින් යුක්තය.</u> ලෝකය තුළ පවතින සෑම සංවිධානාත්මක ආගමක් ම ඉන්දියාව තුළ පවතී. හින්දු - ඉස්ලාම් - ක්‍රිස්තියානි - සීක් - බෞද්ධ - ජෛන නිදර්ශන ලෙස දැක්විය හැකිය.

      <u>ඉන්දියාවේ ක්‍රියාත්මක කුල සංයුතිය</u> නිසා ද ඉන්දීය පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයක් බවට පරිවර්තනය විය. ඉහළ යැයි සම්මත කුල - වෙනත් පසුගාමී කුල - උපලේඛනගත කුල - උපලේඛන ගත ගෝත්‍ර නිදර්ශන ලෙස දැක්විය හැකිය.

    - **ප්‍රාදේශීය මට්ටමින් පවතින වන පන්ති විෂමතාවය.**

      ඉන්දීය සමාජයේ අති දැවැන්ත පන්ති විෂමතාවයක් සහිතය. මෙම පන්තිවිෂමතාවයේ උච්චත්වය ඉන්දීය පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයක් ලෙස ස්ථාපනය වීමට හේතු විය.

    - **ආරම්භක අවස්ථාව තුළම බහු පක්ෂ ආකෘතියකට දේශපාලන පක්ෂ සංවිධානගත වීම.**

- <u>බහු පක්ෂ ක්‍රමය තුළ ඒකපක්ෂ ආධිපත්‍යක් (කොංග්‍රස් පක්ෂයේ) ඉස්මතුවීම හා බිඳවැටීම.</u>

ඉන්දියාව තුළ බහු පක්ෂ ක්‍රමයක් පවතී. නමුත් මුල් අවස්ථාව තුළ ඒකපක්ෂ ආධිපත්‍යයක් ඉස්මතුවීම හඳුනාගත හැකිය. එම පක්ෂය වූයේ කොංග්‍රස් පක්ෂය යි. මෙම පක්ෂයේ ආධිපත්‍යය ඉස්මතු වූ ආකාරය ,

නිදර්ශන : - 1947 සිට 1977 දක්වා ඉන්දියාව පාලනය කරනු ලබන්නේ කොංග්‍රස් පක්ෂය විසිනි. මෙම කාලය තුළ සභාග ආණ්ඩු නිර්මාණය නොවීය. කොංග්‍රස් පක්ෂයට ආණ්ඩුව නිර්මාණය කර ගැනීමට අවශ්‍යය බහුතරය ලබාගැනීමේ පදනමක් තිබුණි. **කොංග්‍රස් පක්ෂය ඒ ඒ මැතිවරණ තුළදී ලෝක් සභාවේ ආසන හිමිකරගත් ආකාරය**

1952 මැතිවරණයේදී - 364
1957 මැතිවරණයේදී - 371
1962 මැතිවරණයේදී - 361
1967 මැතිවරණයේදී - 283
1971 මැතිවරණයේදී - 352
1980 මැතිවරණයේදී - 353
1984 මැතිවරණයේදී - 415

මෙම තත්ත්වය මත මහා බ්‍රිතාන්‍යයේ නිදහස ලබා වසර 60 කට ආසන්න කාලයක් ඉක්ම යද්දී ඉන් වසර 40 ක්ම ඉන්දියාව පාලනය කර ඇත්තේ කොංග්‍රස් පක්ෂය විසිනි.

- කොංග්‍රස් පක්ෂය හැර වෙනත් කිසිදු ආණ්ඩුවකට වසර 05 ක පූර්ණ ධූර කාලය ආණ්ඩුව පවත්වාගැනීමට නොහැකි වීම.

  1977 දී පිහිට වූ මොරාජි දේශායිගේ ආණ්ඩුව වසර 03 ක් පමණක් පැවතීම.

  1989 වී.පී. සිං ගේ ආණ්ඩුව මාස 11 න් බිඳ වැටීම.

  1996 වජ්ජායිගේ ආණ්ඩුව දින 12 න් බිඳ වැටීම. මීළඟට බලයට පැමිණ දේව් ගවුඩා ගේ ආණ්ඩුව මාස 11 න් බිඳ වැටීම. මීළඟට බලයට පැමිණි ගුල් රාල්ගේ ආණ්ඩුව මාස 10 න් බිඳවැටීම. 1998 දී බලයට පැමිණි වජ්ජායිගේ ආණ්ඩුව 1999 දී බිඳවැටීම. මේ ආකාරයට වසර 03 කදී ආණ්ඩු 03 ක් බිඳ වැටීම.

- ඉන්දියානු නිදහස් අරගලයට කොංග්‍රස් පක්ෂය ලබාදුන් දැඩි නායකත්වය.

- රටේ සෑම ප්‍රදේශයකම පැතිරුණු සංවිධාන ව්‍යූහයක් පැවතීම.

- ඉන්දියාවේ ජීවත් වන සෑම කණ්ඩායමක් ම මෙහි නියෝජනය වීම.

- ආකර්ෂණීය නායකත්වය.

මෙම ආකාරයට ඉන්දියානු පක්ෂ ක්‍රමයේ මුල් අදියර තුළ කොංග්‍රස් පක්ෂයේ ආධිපත්‍යයක් ඉස්මතුවී තිබීම හඳුනාගත හැකිය. නමුත් පසුව කොංග්‍රස් පක්ෂයේ ආධිපත්‍ය කිසියම් ආකාරයටකට දියවී යන ආකාරය ඉන්දියාවේ පක්ෂ ක්‍රමය තුළින් විද්‍යමාන වේ. 1996 මැතිවරණයේ දී කොංග්‍රස් පක්ෂය දැවැන්ත ලෙස බිඳවැටීමක් සිදුවිය. 1989 - 1991 මැතිවරණ තුළ කොංග්‍රස් පක්ෂය පරාජයට පත් වුව ද තනි පක්ෂයක් ලෙස වැඩිම ආසන ගණනක් දිනාගත් දේශපාලන පක්ෂය බවට පත් විය. නමුත් 1999 මැතිවරණයේ දී වැඩිම ආසන ගණනක් දිනාගත් පක්ෂය බවට භාරතීය ජනතා පක්ෂය පත්වූ අතර කොංග්‍රස් පක්ෂය දෙවෙනි තැනට පත් විය. ඒ ආසන 140 ක් දිනාගනිමිනි. 1998 මැතිවරණයේ ද කොංග්‍රස් පක්ෂයට දිනා ගැනීමට හැකි වූයේ ආසන 141 පමණි. එහිදී ද දෙවෙනි තැනට පත්වීමට කොංග්‍රස් පක්ෂයට සිදු විය. 1999 දී ද කොංග්‍රස් පක්ෂය ආසන 114 ක් දිනා ගනිමින් දෙවෙනි තැනට පත් විය .මේ ආකාරයට කොංග්‍රස් පක්ෂ ආධිපත්‍යය බිඳ වැටුණි. 2004 මැතිවරණයේදී ආසන 145 ක් දිනා ගනිමින් වෙනත් පක්ෂ සමඟ එකතු වී සහාග ආණ්ඩුවක් නිර්මාණය කර ගනිමින් කොංග්‍රස් පක්ෂය යළි බලයට පත් විය.

මෙම ආකාරයට ඉන්දීය පක්ෂ ක්‍රමය සම්බන්ධ සංවාදය තුළදී විචාරකයින් විසින් ප්‍රධාන කොටස් දෙකකට ඛණ්ඩනය කරමින් එය විග්‍රහයට ලක් කරයි.

I **කොංග්‍රස් පක්ෂය (කොංග්‍රස් ක්‍රමය) ශක්තිමත්ව පැවති අවධිය**

II **කොංග්‍රස් පක්ෂය (කොංග්‍රස් ක්‍රමය) පිරිහීම සිදුවූ අවධිය.**

- <u>ඉන්දීය පක්ෂ ක්‍රමයේ ලක්ෂණ</u>

**(i) බහු පක්ෂ ක්‍රමයක්වීම.**

(**N.B** මෙම තත්ත්වය මීට පෙර විග්‍රහකොට තිබේ.)

**(ii) දේශපාලන පක්ෂ අඛණ්ඩව වර්ධනයවීම.**

ඉන්දියානු පක්ෂ ක්‍රමයේ දැකිය හැකි ලක්ෂණයක් ලෙස පක්ෂ සංඛ්‍යාව අඛණ්ඩව වර්ධනය වීම පෙන්වා දිය හැකිය.

| වර්ෂය | පක්ෂ සංඛ්‍යාව |
|---|---|
| 1952 | 53 |
| 1957 | 15 |
| 1991 | 145 |
| 1996 | 209 |
| 2004 | 230 |
| 2009 | 246 |

**(iii) සහාග ආණ්ඩු නිර්මාණයවීම.**

සහාග ආණ්ඩු නිර්මාණයවීම ඉන්දීය පක්ෂ ක්‍රමය තුළ හඳුනාගත හැකි තවත් ලක්ෂණයකි. 1947 - 1977 කාලය තුළ කොංග්‍රස් පක්ෂයේ ආධිපත්‍යයක් පැවතීම නිසා සහාග ආණ්ඩු නිර්මාණය නොවීය. 1977 පසුව සහාග ආණ්ඩු නිර්මාණය වන ත්ත්තවයක් දැකිය හැකිය.

| | |
|---|---|
| (1977 - 1979 ) | ජනතා සභාගය |
| (1989 - 1991 ) | ජාතික පෙරමුණ |
| (1996 ) | භාරතීය ජනතා පෙරමුණ |
| (1996 - 1998) | එක්සත් පෙරමුණ |
| (1999 - 2004) | ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සංධානය |
| (2004) | එක්සත් ප්‍රගතිශීලී සංධානය |

**(iv) ප්‍රාදේශීය පක්ෂ වල වැදගත්කම් ඉස්මතුවීම.**

සෑම ප්‍රාන්තයකම ශක්තිමත් ප්‍රාදේශීය පක්ෂ එකක් හෝ කිහිපයක් පවතී. මෙම පදනම මත ඉන්දියාවේ ජාතික පක්ෂ වලට ආණ්ඩු පිහිටුවීම සඳහා ප්‍රාදේශීය පක්ෂ වල සහයෝගය ලබාගැනීමට සිදුව තිබේ. ප්‍රාදේශීය පක්ෂ වලට නිදර්ශන ලෙස ,ද්‍රවිඩ මුන්නේශ්වරම් කලහම් පක්ෂය - අකාලි ඩාල් පක්ෂය - තෙලිගු දේශාම් පක්ෂය දැක්විය හැකිය.

**(v) බේදබින්නවී යෑම සහ කැබලි වලට කැඩී යාම.**

ජාතික පදනමක් සහිත පක්ෂ මෙන්ම ප්‍රාදේශීය පදනමක් සහිත පක්ෂ ද මෙම බේදබින්න වීම සහ කැබලිවලට කැඩීයාමේ අර්බුධයට මුහුණපායි. පක්ෂ සංවිධාන ව්‍යුහය ශක්තිමත් නොවීම න්‍යායිකව ඇතිවන ගැටීම වැනි සාධක මත පක්ෂ තුළ බේදබින්න හටගැනීමක් සහ එමගින් පක්ෂ කොටස් වලට කැඩීම සිදුවේ.

**(vi) ජාතිවාදී සහ ආගමික පක්ෂ වල වර්ධනය**

ඉන්දියාව බහුවිධ සමාජයක් නිසා ඒ පදනම මත ජාති වාදී සහ ආගමික හැඩයක් ගත් දේශපාලන පක්ෂ ඉස්මතුවී තිබේ. **සිව සේනා - අකාලි ඩාල් - බහු ජන සමාජ පක්ෂය** වැනි පක්ෂ නිදර්ශන ලෙස දැක්විය හැක.

**(vii) ස්වාධීන මන්ත්‍රීවරුන්ගේ වැදගත්කම හීන වී යාම.**

ස්වාධීන මන්ත්‍රීවරුන්ගේ වැදගත්කම හීනවී යෑම ඉන්දීය පක්ෂක්‍රමයේ තවත් ලක්ෂණයකි. මුල් අවස්ථාව තුළදී ස්වාධීන මන්ත්‍රීවරුන්ට තිබූ වැදගත්කම මේ වන විට මුළුමනින් ම දියවීගොස් තිබේ.

නිදර්ශන : 1952 දී ස්වාධීන මන්ත්‍රීවරු 37 කි. 2009 දී ස්වාධීන මන්ත්‍රීවරු 02 කි.

**කොංග්‍රස් පක්ෂය**

<u>හැඳින්වීම</u>

ඉන්දියාවේ පැරණිම දේශපාලන පක්ෂය මෙය යි. මෙය ඉන්දියානු ජාතික කොංග්‍රසය ලෙස ද හඳුන්වයි. 1885 දී මෙහි ඇරඹීය සටහන් වෙයි. කොංග්‍රස් පක්ෂය ආරම්භ වන්නේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහි ජාතික ව්‍යාපාරයක් ලෙසිනි.

■ <u>නිදහසට පූර්ව තත්ත්වය තුළ ඉන්දියානු ජාතික කොංග්‍රසය</u>

මුල් අවස්ථාව තුළ කොංග්‍රසය සංවිධානගත වන්නේ බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදී බූවල්ලාගෙන් සිය දේශය නිදහස් කරගැනීම සඳහා ය. කොංග්‍රසයට නායකත්වය සැපයූ පදනම මත එය කොටස් 03 කට බණ්ඩනය කළ හැකිය.

මධ්‍යස්ථ මතධාරීන් (1885 - 1905)
සටන්කාමීන් (1905 - 1920)
මහත්මා ගාන්ධි (1920 - 1947)

**1885 - 1905** අතර කාලය තුළ ජාතික කොංග්‍රසයේ නායකත්වය මධ්‍යස්ථ මතධාරීන් අත පැවතුනි. ඔවුන්ගේ අරමුණ වූයේ <u>බ්‍රිතාන්‍යය පාලනය යටතේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ දිනාගැනීමය.</u>

**1905 - 1920** අතර කාලය තුළ කොංග්‍රසයේ නායකත්වය සටන්කාමීන් සතුවිය. <u>ස්වරාජ් මෙවත් ස්වයං පාලනය දිනාගැනීම ඔවුන්ගේ අරමුණ විය.</u>

**1920 - 1947** අතර දක්වා ජාතික කොංග්‍රසයට නායකත්වය සපයනු ලැබුවේ මහත්මා ගාන්ධීය. මෙහිදී මෙය බහුජන ව්‍යාපාරයක් බවට පත්කරන ලදී. <u>කොංග්‍රසය අවිහිංසාවාදී ප්‍රතිපත්තියක් භාවිතා කරමින් පූර්ණ නිදහස දිනාගැනීම සඳහා කටයුතු කරන ලදී.</u>

■ **<u>නිදහසින් පසු ඉන්දියානු ජාතික කොංග්‍රසය</u>**

(**N.B** මෙම තත්ත්වය මීට පෙර විග්‍රහකොට තිබේ.)

1947 - 1977 අතර කාලය තුළ අඛණ්ඩව ඉන්දියාව පාලනය කළ දේශපාලන පක්ෂය බවට පත්වන්නේ කොංග්‍රස් පක්ෂයයි. මෙය වසර 30 අධික කාලයකි. 1977 මැතිවරණයෙන් කොංග්‍රස් පක්ෂය පරාජයට පත්විය. යළි 1980 - 1984 මැතිවරණ කොංග්‍රස් පක්ෂය ජයග්‍රහණය කරනු ලබයි. නමුත් වර්තමානය වන විට මෙය කිසියම් ප්‍රමාණයට දියව ගොස් තිබේ.

**කොංග්‍රස් පක්ෂය බෙදබින්න වී යාම**




**කොංග්‍රස් පක්ෂයේ සංවිධාන ව්‍යුහය**

කොංග්‍රස් පක්ෂයේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය පිළිගත් පාර්ලිමේන්තු වාදී පක්ෂයකි. මෙම පක්ෂය තුළ ගාන්ධි - නේරු පෙළපත් දෙකේ ආධිපතිත්වය යටතේ බලවත් සංවිධාන යාන්ත්‍රනයක් නිර්මාණයවී තිබේ. මෙම පක්ෂ සංවිධානය තුළ ඉහළම සිටින්නේ පක්ෂයේ සභාපතිවරයාය. ඔහු ඇතුළු 20 සමාජිකයන්ගෙන් කෘත්‍යාධිකාරී මණ්ඩලය සංවිධාන ගතව තිබේ.

දේශපාලන දෘෂ්ටිය

කොංග්‍රස් පක්ෂය ලිබරල්වාදී දේශපාලන දෘෂ්ටිය පිළිගත් පක්ෂයකි. මුල් අවස්ථාව තුළ එම පක්ෂය තුළ ගාන්ධි වාදය - සමාජ වාදය - ලිබරල්වාදය යන දෘෂ්ටිවාද 03 මත සංවිධාන ගතව තිබුණි. 1990 සිට ලිබරල්වාදී දෘෂ්ටිවාදය පමණක් කොංග්‍රස් පක්ෂය පිළිගෙන තිබේ.

ආර්ථික දෘෂ්ටිය

ආරම්භයේදී කොංග්‍රස් පක්ෂයේදී ආර්ථික දර්ශනය බවට සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පිළිගෙන තිබුණි. 1991 පසුව ධනවාදී අර්ථක්‍රමය කොංග්‍රස් පක්ෂයේ ආර්ථික දෘෂ්ටිය බවට පත්විය.

විදේශ ප්‍රතිපත්තිය

1980 දක්වා කොංග්‍රස් පක්ෂයේ විදේශ ප්‍රතිපත්තිය බවට පත්ව තිබුණේ නොබැඳි ප්‍රතිපත්තිය යි. නමුත් කොමියුනිස්ට් රාජ්‍යයන් කෙරෙහි වැඩි නැඹුරුවක් පැවතුණි. පසුව වර්තමානය වන විට විදේශ ප්‍රතිපත්තිය බවට පත්ව තිබෙන්නේ බටහිර කඳවුරට සහ ආසියාවේ බලවතුන් කෙරෙහි නැඹුරු වූ විදේශ ප්‍රතිපත්තියකි.